පුද්ගලික ඩිජිටල් ගිණුම

නියම හා කොන්දේසි

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනය ("බැංකුව") විසින් නිශ්චිතව දක්වනු ලබන ප්‍රමාණය දක්වා හැර, බැංකුව විසින් පිරිනමනු ලබන ඩිජිටල් මාර්ගයක් හරහා ගිණුම්හිමියා විසින් මෙහි මින්මතු විවෘත කරනු ලබන ("ගිණුම") ඕනෑම ස්වභාවයක එක් එක් සහ සෑම ගිණුමක් සඳහාම මෙම නියම හා කොන්දේසි ("නියම හා කොන්දේසි") අදාළ විය යුතු ය.

බැංකුව විසින් එකී ගිණුම/ගිණුම් විවෘත කිරීම සහ/හෝ අඛණ්ඩව පවත්වාගෙන යෑම සහ/හෝ මා වෙත බැංකු පහසුකම් පිරිනැමීම පිළිබඳ සැලකිල්ලට ගෙන, මෙම නියම හා කොන්දේසි මගින් බැඳී සිටීමට මම එකඟ වෙමි.

එක් එක් තැනැත්තා තනි තනිවද ඕනෑම තැනැත්තකු හෝ වැඩිදෙනෙකු හෝ ඔවුන්ගේ උරුමක්කරුවන්, පොල්මඃකරුවන්, අද්මිනිස්ත්‍රාසිකරුවන් සහ පැවරුම්ලාභීන් හෝ ඔවුන් සියලු දෙනාම සාමූහිකවද මෙම නියම සහ කොන්දේසි මගින් බැඳී සිටිය යුතු වේ.

ඒක වචන යෙදුම් සඳහා බහු වචනද බහු වචන යෙදුම් සඳහා ඒක වචන යෙදුම්ද පුරුෂලිංග අර්ථයන් සහිත වචන සඳහා ස්ත්‍රීලිංග අර්ථයන්ද ඇතුළත් වේ.

1. මෙහෙයුම් උපදෙස්

මා විසින් බැංකුව වෙත (ඩිජිටල් ආකාරයෙන් හෝ අන්‍යාකාරයකින් ලිඛිතව) පටහැනිව ලිඛිත නිවේදනයක් ලබාදෙන තෙක්, පුද්ගල ගිණුම් විවෘත කිරීමේ ආකෘතිපත්‍රය සහ වෙනත් යම් අතිරේක මැන්ඩේට්පත්‍ර ඇත්නම් එම මැන්ඩේට්පත්‍රවල (සාමූහිකව “මැන්ඩේට් පත්‍රය” යනුවෙන් සඳහන් කරනු ලබන) ලබාදී ඇති මෙහෙයුම් උපදෙස් ප්‍රකාරව ලියා අත්සන් කරන හෝ පිළිගනු ලබන පෑන් අත්සනක් සහ/හෝ භෞතික අත්සනක් සහ/හෝ ඩිජිටල් අත්සනක්/ඉලෙක්ට්‍රොනික අත්සනක්

වශයෙන් අත්සන්කරනු ලබන අත්සන් කල උපදෙස් හෝ ලේඛන මත පහත කරුණු සම්බන්ධයෙන් ක්‍රියාකිරීම සඳහා මා විසින් බැංකුව වෙත බලය පවරා සිටිමි. එනම්-

(i) බැරකම් වශයෙන් හෝ අන්‍යාකාරයකින් ගිණුම(ගිණුම්) හරකිරීම මගින් චෙක්පත්ගෙවීම්, විනිමය බිල්පත් ගෙවීම්, පොරොන්දු නෝට්ටු ගෙවීම්, ස්ථාවර නියෝග ගෙවීම්, ඍජු හරකිරීම් ගෙවීම්, අණකර නිකුත්කිරීම, තැපැල් සහ ටෙලිග්‍රැෆික් පැවරීම්, සුරකුම්පත් සහ විදේශ ව්‍යවහාර මුදල් මෙන්ම වෙනත් සාධනපත්‍ර මිලදී ගැනීම සහ විකිණීම සහ ශේෂ තහවුරුකිරීම් ඉල්ලා සිටීම. සහ

(ii) ගිණුම් වසා දැමීම සඳහා වූ උපදෙස් ඇතුලු ගිණුම (ගිණුම්) සම්බන්ධයෙන්වූ වෙනත් යම් උපදෙස් පිළිගැනීම (මෙහෙයුම් උපදෙස්).

මෙහෙයුම් උපදෙස්වල යම් වෙනස්කිරීමක් හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමක් මා විසින් පරම වශයෙන් ලබාදිය යුතු බවට මම එකඟව සිටිමි.

2. ජංගම ගිණුම/ඉතිරිකිරීමේ ගිණුම

(i) ජංගම ගිණුමක් සම්බන්ධයෙන් වන අවස්ථාවකදී, බැංකුව විසින් ස්වකීය පරම අභිමතය පරිදි, මා වෙත චෙක්පොතක් නිකුත්කරනු ලැබිය හැකි වේ. එසේ චෙක් පොතක් නිකුත් කරනු ලැබුවහොත්, සියලු අවස්ථාවලදී එම චෙක් පොත ආරක්ෂිතව භාරයේ තබාගැනීම සම්බන්ධයෙන් වූ වගකීම මා විසින් භාරගෙන සිටින අතර එකී චෙක්පොත හෝ එහි අන්තර්ගත චෙක්පත්‍රිකාවක්/චෙක්පත්‍රිකා නැතිවුවහොත් හෝ සොරකමට ලක්වුවහොත්, ඒ පිළිබඳව මම වහාම බැංකුව වෙත නිවේදනය කරමි. ගිණුමේ නිෂ්කාශනය වූ මුදල් සම්බන්ධයෙන් චෙක්පත් නිකුත් කිරීම සඳහාද මා විසින් වගකීම් භාරගෙන සිටිමි. මා අතින් අදාළ චෙක්පත/චෙක්පත් නැති වී ඇති අවස්ථාවකදී හෝ නීතිය මගින් ඉඩ ලබාදී ඇති සහ බැංකුව විසින් එකඟ වී ඇති වෙනත් අවස්ථානුගත කරුණුවලදී මාගෙන් (වාචිකව හෝ ලිඛිතව) ලැබෙන චෙක්පත් ගෙවීම් නතර කිරීමේ උපදෙස් බැංකුව විසින් ස්වකීය පරම අභිමතය පරිදි

පිළිගනු ලැබිය හැකි බවට මා විසින් එකඟව සිටිනු ලැබේ. යම් වාචික ඉල්ලීමක් එදිනම (ඩිජිටල් ආකාරයෙන් හෝ අන්‍යාකාරයකින් ලිඛිතව) ලිඛිත තහවුරු කිරීමක් සමගින් ඉදිරිපත් කළ යුතුවේ. මාගෙන් හෝ මාගෙන් ලෙස සලකණු ලබන වෙනත් යම් තැනැත්තකුගෙන් ලැබෙන යම් උපදෙසක් බැංකුව විසින් පිළිගෙන ඇති අවස්ථාවකදී, එහි ප්‍රතිඵලයක් ලෙස හෝ ඒ හා සම්බන්ධයෙන් දරනු ලබන පාඩු, අලාභ, පිරිවැය (නෛතික පිරිවැයද ඇතුලු) හෝ ඉල්ලීම්වලට එරෙහිව බැංකු හානිපූර්ණය කර තබන බවට මා විසින් මෙයින් ප්‍රතිඥාදී සිටිනු ලැබේ.

(ii) ඉහත සඳහන් ගිණුම (ගිණුම්) සම්බන්ධයෙන් උපචිත වන අයිරා හෝ වෙනත් පහසුකම් සම්බන්ධයෙන් මා විසින් වගකියනු ලබන අතර බැංකුවේ පරම අභිමතය පරිදි කලින්කල බැංකුව විසින් තීරණය කරනු ලැබිය හැකි අනුප්‍රමාණ යටතේ ඒ සම්බන්ධයෙන් දරන ලද සියලු හෝ යම් පොලී මුදල් (වැල් පොලියද ඇතුලු), කොමිස් මුදල් සහ වෙනත් බැංකු ගාස්තු, පිරිවැය සහ වියදම් (නෛතික පිරිවැයද ඇතුලු) එකී ගිණුමෙන් (ගිණුම්වලින්) හරකිරීම සඳහා මා විසින් මෙයින් බැංකුව වෙත බලය පවරා සිටිනු ලැබේ. බැංකුව විසින් ස්වකීය පරම අභිමතය පරිදි නියම කරනු ලබන ආකාරයට සහ නියම කරනු ලබන අවස්ථාවලදී එම මුදල් බැංකුව වෙත ගෙවනු ලබන බවට මා විසින් ප්‍රතිඥා දී සිටිනු ලැබේ.

(iii) පොළිය සම්පූර්ණයෙන් ගෙවා නිමවන තෙක් ගෙවිය යුතු පොළී මුදල් (වැල්පොළියද ඇතුලු) අඩුකිරීම සඳහා ඒ හා සම්බන්ධ යම් අයිරා පහසුකමක් හෝ වෙනත් යම් බැංකු පහසුකම් පවතින අතරතුරදී ඉහතකී ගිණුමට බැරවන යම් සහ සියලු මුදල්, බැංකුව පළමුව අදාළ කරගනු ලැබිය යුතුය. ඉන්පසුව, එසේ බැරකරනු ලබන මුදල්, එකී අයිරා හෝ වෙනත් යම් බැංකු පහසුකම්වල මූලික මුදල් අඩුකිරීම කෙරෙහි අදාළ කර ගනු ලැබිය යුතුය.

(iv) ගිණුම් සම්බන්ධයෙන් හෝ බැංකුව විසින් මා වෙත ලබාදෙන වෙනත් බැංකු පහසුකම් සම්බන්ධයෙන් වූ සියලු සාම්ප්‍රදායික බැංකු ගාස්තු සහ වෙනත් ගාස්තු මෙන්ම වියදම් අයකිරීම හෝ පැනවීම සඳහා මෙන්ම බැංකුවේ සාමාන්‍ය බැංකු කාර්යපටිපාටි ප්‍රකාරව අදාළ ගිණුමෙන් (ගිණුම්වලින්) මුදල් හරකිරීම සඳහා බැංකුව

වෙත නිතරම හිමිකමක් ඇත්තේය. යම් ගිණුමක් (ගිණුම්) හෝ සියලුම ගිණුම් අවසන් කිරීමෙන් /වසා දැමීමෙන් පසුව එකී ගාස්තු ආපසු ගෙවනු නොලබන බවට මා විසින් එකඟව සිටිනු ලැබේ.

(v)

(අ) එකී ගිණුමේ බැරට සිදුකරන තැන්පතු සහ එකී ගිණුමෙන් සිදු කරන හරකිරීම් ශ්‍රී ලංකාවේ කලින් කළ බලපැවැත්වෙන නීති මගින් පාලනය වන බවත්, එම තැන්පතු මුදල් බැංකුවට පිළිගත හැකි හැඳුනුම්පත්‍රයක් ඉදිරිපත් කිරීමට යටත්ව සහ බැංකුව විසින් කලින්කල අයකරනු ලැබිය හැකි සාම්ප්‍රදායික ගාස්තු ගෙවීමට යටත්ව ඕනෑම බැංකු ශාඛාවකදී ආපසු ගෙවනු ලැබිය යුතු බවටත් මා විසින් පිළිගෙන සිටිනු ලැබේ.

(ආ) ඇමතුම් තැන්පතුවලින් මුදල් ආපසු ලබාගැනීම් සඳහා අවම වශයෙන් දින හතක (7) ලිඛිත නිවේදනයක් අවශ්‍ය වන බවත් එසේ නිවේදනයක් ලබාදීමට අපොහොසත් වුවහොත් මා හට පොළිය ලබාගැනීමට හිමිකමක් නොලබන බවත් මා විසින් අවබෝධ කරගෙන සිටිනු ලැබේ.

(vi)

(අ) ඉතුරුම්/තැන්පතු ගිණුම/ගිණුම් මත අය කරනු ලබන පොළී අනුපාතිකය ශ්‍රී ලංකාවේ බැංකු ශාඛාවල/බැංකුවේ නිල වෙබ් අඩවියෙහි ප්‍රදර්ශනය කරනු ලබන අතර එසේ ප්‍රදර්ශනය කිරීම මා වෙත යථා පරිදි නිවේදනය කිරීමක් සංයුක්ත කරනු ලබයි.

(ආ) පොළිය ගණනය කිරීමේ සෑම එක් එක් දිනයේදීම ගිණුමේ/ ගිණුම්වල නියමිත අවම ශේෂය පවත්වාගෙන යන අවස්ථාවකදී පමණක් දෛනික ශේෂය මත ඉතුරුම් ගිණුම් සම්බන්ධයෙන් වූ පොළිය ගණනය කර මාසිකව ගිණුමට බැර කරනු ලැබේ. ජංගම ගිණුම්වල පවතින බැරකම් ශේෂ මත පොළිය ගෙවනු නොලැබේ.

(ඇ) යම් තැන්පතු ගිණුමක්/ගිණුම් මත වූ පොළිය එදිනෙදා අතිරික්ත වශයෙන් හෝ (බැංකුවේ පරම අභිමතය පරිදි) බැංකුව විසින් තීරණය කරනු ලබන අන්‍යාකාරයකින් උපචිත වන අතර එම පොළිය බැංකුව විසින් අදාල තැන්පතු ගිණුමට (ගිණුම්වලට) හෝ මා විසින් උපදෙස් දෙනු ලබන ආකාරයට වෙනත් යම් ගිණුමකට බැර කරනු ලැබිය හැකිය.

(vii)

(අ) බැංකුව විසින් ස්වකීය පරම අභිමතය පරිදි ස්ථාවර තැන්පතුවලින් කල්පිරීමට පෙරාතුව මුදල් ආපසු ගැනීම සඳහා ඉඩ දෙනු ලැබිය හැකි නමුත් එකී උපදෙස් මා විසින් පරම වශයෙන් ලබා දිය යුතුවේ. එවැනි සියලු කල්පිරීමට පෙරාතුව මුදල් ආපසු ලබාගැනීම් බැංකුව විසින් තීරණය කරනු ලබන ආකාරයට දඩ මුදල් සහ ගාස්තු අයකිරීමට යටත්වන බවට මා විසින් පිළිගෙන සිටිනු ලැබේ.

(ආ) කල් පිරීමේ දිනයට පෙරාතුව වූ වැඩකරන දින හතක (07) කාලයක් ඇතුළත පටහැනිව (ඩිජිටල් ආකාරයෙන් හෝ අන්‍යාකාරයකින් ලිඛිතව) ලිඛිත උපදෙස් ලැබී නොමැති අවස්ථාවකදී එවිට අලුත්කිරීමේ අවස්ථාවේදී බලපවත්නා පොලි අනුපාතිකය යටතේ සියලුම ස්ථාවර තැන්පතු සමාන කාලසීමක් සඳහා ස්වයංක්‍රියව අලුත් වනු ඇත.

(viii) මා විසින් ඉල්ලා සිටිනු ලබන කාලසීමාවක් සඳහා බැංකුව විසින් මා වෙත ගිණුම් ප්‍රකාශයක් (ගිණුම් ප්‍රකාශ) එවනු ලබන බවට මම පිළිගෙන සිටිමි. එවැනි උපදෙස් ලබාදී නොමැති අවස්ථාවකදී, බැංකුවේ සාමාන්‍ය බැංකු කාර්යපටිපාටිවලට අනුකූලව අදාල ගිණුම් සම්බන්ධයෙන් බැංකුව විසින් තීරණය කරනු ලබන යම් කාලසීමා සඳහා ගිණුම් ප්‍රකාශය යවනු ලැබේ. එම ගිණුම් ප්‍රකාශවල සඳහන් වන සියලු සටහන් වහාම පරීක්ෂාකිරීම සම්බන්ධයෙන් මම පරම වශයෙන් වගකියනු ලැබිය යුතු බවටත් එම ගිණුම් ප්‍රකාශ සහ මා විසින් පවත්වාගෙන යනු ලබන වාර්තා අතර පවතින බවට මා විසින් විශ්වාස කරනු ලබන යම් විෂමතා ඇත්නම් එම විෂමතා පිළිබඳව අදාළ ගිණුම් ප්‍රකාශ දිනයේ සිට දින දාහතරක (14) කාලසීමාවක් ඇතුළත (ඩිජිටල් ආකාරයෙන් හෝ අන්‍යාකාරයකින් ලිඛිතව) බැංකුව වෙත මා විසින් ලිඛිත

නිවේදනයක් ලබාදිය යුතු බවටත් මා විසින් මෙයින් එකඟව සිටිනු ලැබේ. මාගෙන් එවැනි නිවේදනයක් ලැබී නොමැති අවස්ථාවකදී, අදාළ ගිණුම් ප්‍රකාශයේ (ගිණුම් ප්‍රකාශවල) නිවැරදිභාවය පිළිබඳව මා විසින් (සියලු කාර්යය සඳහා) පරම වශයෙන් එකඟ වී සහතික කර ඇති ලෙස සලකනු ලැබිය යුතුය. ඉහතකී කරුණුවලට අගතියක් සිදුවීමෙන් තොරව සහ මේ සම්බන්ධයෙන් බැංකුව මත කිසිදු වගකීමක් පැවරීමෙන් තොරව, එම ගිණුම් ප්‍රකාශය (ගිණුම් ප්‍රකාශ) සම්බන්ධයෙන් බැංකුව විසින් පසුව යම් වරදක් අනාවරණය කරගනු ලැබුවහොත්, බැංකුව විසින් එම වරද අනාවරණය කරගත් වහාම (උචිත ආකාරයට) මාගේ ගිණුම (ගිණුම්) හරකිරීම හෝ බැරකිරීම මගින් බැංකුව විසින් එම වරද නිවැරදි කරනු ලැබිය හැකි බවට මා විසින් මෙයින් එකඟව සිටිනු ලැබේ.

(ix) බැංකුව විසින් තෝරාගන්නේ නම් පහත සඳහන් ආයතනවලින් ලැබෙන යම් සහ සියලු විමසීම සඳහා මාගෙන්/අපගෙන් විමසීමෙන් තොරව ප්‍රතිචාර දැක්වීම සඳහා මා විසින් බැංකුව වෙත බලය පවරමි; එනම්

(අ) මාගෙන්/අපගෙන් විමසීමෙන් තොරව වෙනත් යම් බැංකුකරුවන්, ණය තොරතුරු කාර්යාංශය හෝ ගිණුමට/ගිණුම් වලට අදාළ වෙනත් යම් අධිකාරියක් වෙතින් ලැබෙන විමසීම්. සැකදුරු කිරීමේ කාර්යය සඳහා, එවැනි ප්‍රතිචාර සඳහා බැංකු යොමුවක්ද ඇතුළත්විය හැකි වේ.

(ආ) මාගේ ගිණුමට (ගිණුම්වලට)/ පහසුකම්වලට අදාළ බැංකුවේ යම් අයිතිවාසිකම් හෝ වගකීම් සම්බන්ධයෙන් වූ සැබෑ හෝ විභව්‍ය පැවරුම්ලාභියකු, සහභාගීවන්නකු හෝ ගිවිසුම්ගත පාර්ශවයක් වෙතින් ලැබෙන විමසීම්.

(x)

(අ) නම් කළ විද්‍යුත් ලිපිනයක් හරහා, කෙටි පණිවුඩ සේවය (SMS) හරහා, ෆැක්සිමිලි මගින්, විද්‍යුත් තැපැල, දුරකථනය යනාදිය හරහා බැංකුවේ සියලු අලෙවිකරන තොරතුරු හෝ එහි නිෂ්පාදන/සේවා ලබාදීම සඳහා මා විසින් බැංකුව වෙත බලය පවරා සිටිනු ලැබේ.

(ආ) බැංකුව විසින්, ස්වකීය පරම අභිමතය පරිදි තුන්වන පාර්ශවයක් වෙත යම් ක්‍රියාකාරකම් පැවරීම් සහ ගිණුම (ගිණුම්) පිළිබඳ විස්තර එවැනි තුන්වන පාර්ශව වෙත සැපයීම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් ගිණුම්හිමියා පිළිබඳ, ගිණුම (ගිණුම්) සහ/හෝ ගනුදෙනුව (ගනුදෙනු) පිළිබඳ තොරතුරු සකස් කිරීම, හුවමාරු කරගැනීම සහ ගබඩා කිරීම බැංකුවට අවශ්‍යවන බවත් ඒ සඳහා බැංකුව වෙත බලය පවරනු ලබන බවටත් එම තොරතුරු බැංකුවෙහි පාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම් සමග හුවමාරු කිරීම හෝ සම්ප්‍රේෂණය කිරීමට අවශ්‍ය වන බවත් ඒ සඳහා බැංකුව වෙත බලය පවරනු ලබන බවත් බැංකුව විසින් සේවයේ යොදවන ලද යම් ආයතනයක් හෝ නියෝජිතයකු හෝ තුන්වන පාර්ශවයක් සමග එම තොරතුරු හුවමාරු කිරීම හෝ සම්ප්‍රේෂණය කිරීම බැංකුවට අවශ්‍ය වන බවත් ඒ සඳහා බලය පවරනු ලබන බවටත් ගිණුම්හිමියා (ගිණුම්හිමියන්) විසින් පිළිගෙන සිටිනු ලැබේ.

(xi)

(අ) මාගේ අවසන්වරට වාර්තා වී ඇති ලිපිනය වෙත දින දාහතරක (14) ලිඛිත නිවේදනයක් ලබාදීම මගින් තත්කාරය සඳහා හේතු දැක්වීමෙන් තොරව යම් ගිණුමක් විවෘත කිරීම ප්‍රතික්ෂේප කිරීම සඳහා හෝ යම් ගිණුමක් වසා දැමීම සඳහා බැංකුව වෙත බලය රඳවා ගනු ලැබේ.

(ආ) බැංකුව විසින්, ස්වකීය අවශ්‍යතාවය අනුව හෝ අධිකරණයක හෝ පරිපාලන නියෝගයක අවශ්‍යතාවය අනුව හෝ අන්‍යාකාර හේතුවක් නිසා, මා වෙත පූර්ව නිවේදනයක් ලබාදීමෙන් තොරව හෝ බැංකුව විසින් මා වෙත ඉටු කළ යුතු යම් වගකීමක් උල්ලංඝනවීම සඳහා යටත්වීමෙන් තොරව, යම් ගිණුමක් (ගිණුම්) සම්බන්ධයෙන් වූ ගනුදෙනු කටයුතු අවසන් කිරීම, තහනම් කිරීම හෝ අත්හිටුවීම කරනු ලැබිය හැකිය.

(ඇ) මාස විසිහතරක (24)ක කාලසීමාවක් තිස්සේ අක්‍රියව පවතින යම් ගිණුමක් (ගිණුම්) සහ/හෝ (බැංකුව විසින් කලින්කල තීරණය කරනු ලබන) අවම

ශේෂය පවත්වාගෙන යනු නොලබන යම් ගිණුමක් (ගිණුම්), මාගේ අවසන්වරට වාර්තා වී ඇති ලිපිනය වෙත ගිණුම් වසා දැමීම පිළිබඳ දින දාහතරක (14) ලිඛිත නිවේදනයක් ලබාදීමෙන් පසුව වසා දැමීමේ අයිතිය බැංකුව වෙත රඳවා ගනු ලැබේ.

(ඈ) සියලුම ගිණුම් සඳහා බැංකුවේ පරම අභිමතය පරිදි කලින් කල වෙනස් කිරීමට යටත්වන අවම ශේෂයක් පවත්වාගෙන යෑමේ අවශ්‍යතාවයක් පවතියි. මා විසින් එම අවම ශේෂය සපුරාලණු නොලැබුවහොත් එවැනි යම් ගිණුමක් (ගිණුම්) මත බැංකුව විසින් සේවා ගාස්තුවක් සහ/හෝ වෙනත් අදාළ ගාස්තු අයකරනු ලැබිය හැකිය. තත්කාලය බලපවත්නා ගාස්තු අයකිරීම් අදාළ විය යුතුය.

(ඊ) යම් ගිණුමක් වසා දැමීමට අදාළ බැංකු ගාස්තු ගෙවීමට යටත්ව පූර්ව ලිඛිත නිවේදනයක් (ඩිජිටල් ආකාරයෙන් හෝ අන්‍යාකාරයකින් ලිඛිතව) ලබාදීම මගින් මා විසින් ඉහත සඳහන් ගිණුම (ගිණුම්) වසා දමනු ලැබිය හැකි බවට මම පිළිගෙන සිටිමි.

(xii) බැංකුව විසින් නියම කරනු ලැබිය හැකි ලේඛනමය සාක්ෂියක් ද සමග එවැනි සිදුවීමක් පිළිබඳව බැංකුව වෙත ලිඛිත නිවේදනයක් (ඩිජිටල් ආකාරයෙන් හෝ අන්‍යාකාරයකින් ලිඛිතව) ලැබී ඇත්නම් මිස සහ ලැබෙන තෙක්, යම් ගිණුමක ගනුදෙනු කටයුතු සම්බන්ධයෙන්, මාගේ මරණය සිදුවීම, අශක්නුකතාවය හෝ බංකොලොත්භාවය සිදුවීම (හෝ වෙනත් යම් සමාන සිදුවීමක් හෝ කටයුත්තක්) හේතුවෙන් උපචිත වන පාඩු සඳහා බැංකුව වගකියනු නොලැබිය යුතු ය. තවද, රජයේ ක්‍රියාවක් හෝ රාජ්‍ය නියෝජිත ආයතනයක හෝ අධිකාරියක ක්‍රියාවක් හේතුවෙන් පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හේතුකාරක වන හෝ යම් ලිඛිත නීතියක් ප්‍රකාරව බැංකුව විසින් සිදු කරන ලද හෝ සිදුකිරීම මගහරින ලද යම් ක්‍රියාවක් හේතුවෙන් හෝ බැංකුවේ පාලනයෙන් පරිබාහිර වෙනත් හේතුවක් නිසාවෙන් (වැඩ වර්ජන, කාර්මික ක්‍රියාකාරකම්, උපකරණ අක්‍රියවීම හෝ බලසැපයුම් බිඳවැටීම යනාදිය ඇතුලු ඊට සීමා නොවන) පූර්ණ වශයෙන් හෝ අර්ධ

වශයෙන් සිදුවන පාඩු, අලාභ හෝ ප්‍රමාදවීම් සම්බන්ධයෙන් බැංකුව වගකියනු නොලැබිය යුතුවේ. එකී සිදුවීම් හේතුවෙන් සිදුවිය හැකි බවට අපේක්ෂා කල හැකි ප්‍රමාදවීම් සම්බන්ධයෙන් බැංකු ශාඛාවල නිවේදනය කිරීම මගින් හෝ අන්‍යාකාරයකින් ස්වකීය ගනුදෙනුකරුවන් වෙත පොදුවේ නිවේදනය කිරීම සඳහා බැංකුව විසින් උත්සාහ දරනු ලැබිය හැකි ය.

(xiii) මා විසින් බාලවයස්කරුවකු වෙනුවෙන් ගිණුමක් විවෘත කරනු ලබන අවස්ථාවකදී, මෙම නියම සහ කොන්දේසිවලට අමතරව, එම ගිණුමට අදාළ වන නියම සහ කොන්දේසි පිළිගැනීම සඳහා මම එකඟව සිටිමි.

(xiv) ලියන් අයිතියක්, ගාස්තුවක්, ඔඩපනය කිරීමක්, හිලව් කිරීමක්, ප්‍රතිහිමිකම්පෑමක් හෝ ඕනෑම අන්‍යාකාර කරුණක් තුළින් උපචිත වන එම බැරකම් ශේෂය, ඈපකර ආදිය සම්බන්ධයෙන් බැංකුව සතුවන යම් අයිතියක් බැංකුව විසින් ක්‍රියාත්මක කිරීමට යටත්ව පමණක් හෝ යම් තැනැත්තකුගේ හිමිකම්පෑමක් ප්‍රකාරව බැංකුව විසින් ගනු ලැබීමට යෝග්‍ය බවට බැංකුව විසින් සලකනු ලබන වෙනත් යම් පියවරක් ගැනීමට යටත්ව පමණක් මම මියයෑමෙන් පසුව, පවතින යම් බැරකම් ශේෂයක් සහ/හෝ ජීවත්ව සිටින තැනැත්තාගේ (තැනැත්තන්ගේ) යම් බැරකම් ශේෂයක්, බැංකුව විසින් මුදාහරිනු ලැබිය යුතු බවට මා විසින් මෙයින් ප්‍රතිග්‍රහණය කර පිළිගෙන සිටිනු ලැබේ.

3. ෆැක්සිමිලි/ඊමේල් මගින් ලැබෙන බැංකු උපදෙස්

(i) (4 වන කරුණෙහි සඳහන් විධිවිධානවල කුමක් සඳහන් වුවද, එය නොසලකා හරිමින්) මා විසින් ඔබ වෙත පටහැනිව ලිඛිත උපදෙස් ලබා දී ඇත්නම් මිස, ෆැක්සිමිලි යන්ත්‍රයක් හරහා හෝ නම් කළ විද්‍යුත් ලිපිනයක් හරහා සම්ප්‍රේෂණය කරනු ලබන (අන්‍යාකාරයකින් පටහැනිව ප්‍රකාශිතව සඳහන් කර ඇත්නම් මිස මෙම නියම සහ කොන්දේසිවලට අදාළව මා විසින් ලබාදීමට නියමිත හෝ ලබාදෙන උපදෙස් ඇතුළු) මාගේ බැංකු කටයුතු පිළිබඳ උපදෙස් මත බැංකුව විසින්

ක්‍රියාකිරීමට බැඳී නොසිටියද, එසේ එම උපදෙස් මත ක්‍රියාකිරීම සඳහා බැංකුව වෙත බලය පවරා සිටිනු ලැබේ. මා විසින් බැංකුව වෙත ලබාදෙන මෙහෙයුම් උපදෙස් ප්‍රකාරව මාගේ උපදෙස්වල පරිලෝකනය කරන ලද අත්සන් කල පිටපතක් එම විද්‍යුත් පණිවුඩ සමග ඉදිරිපත් කළ යුතුවේ. මෙම කාර්ය සඳහා වූ නම් කළ විද්‍යුත් ලිපිනය බැංකුව වෙත සපයා ඇති මාගේ/ ගිණුම්හිමියන්ගේ විද්‍යුත් ලිපිනය විය යුතුය. ගිණුම්හිමියා/ගිණුම්හිමියන් විසින් පත්කරනු ලබන ඇටෝර්නි බලකරුවන් සඳහා මෙය අදාළ නොවිය යුතුය.

(ii) පහත සඳහන් කරුණුවල ප්‍රතිඵලයක් වශයෙන් හෝ එම කරුණුවලට යම් ආකාරයකින් සම්බන්ධිත වන ඕනෑම ආකාරයකින් උපචිත වන සියලු සිවිල් නඩු අපරාධ නඩු, නඩු කටයුතු, පිරිවැය, හිමිකම් පෑම්, ඉල්ලීම්, ගාස්තු, වියදම්, පාඩු සහ වගකීම්වලින් සහ ඒවාට එරෙහිව මා විසින් බැංකුව නිදහස් කර හානි පූර්ණය කර අගතිවිරහිතව තබනු ලැබේ.

(අ) මාගේ උපදෙස (උපදෙස්) වැරදීමකින් සිදුකර හෝ සම්ප්‍රේෂණයකර තිබුණද, වංචාසහගත ලෙස වෙනස් කර තිබුණද, සන්නිවේදනයේදී හෝ සම්ප්‍රේෂණයේදී වැරදි සහගත ලෙස අවබෝධකරගෙන හෝ විකෘති කර තිබුණද එය නොසලකා හරිමින්, ඉහතකී නම් කළ විද්‍යුත් ලිපිනය හරහා එවනු ලබන මාගේ ලිඛිත ෆැක්සිමිලි උපදෙස (උපදෙස්) හෝ උපදෙස් ප්‍රකාරව බැංකුව විසින් සද්භාවයෙන් ක්‍රියාකිරීම; සහ

(ආ) මාගේ ලිඛිත, දුරකථන, ෆැක්සිමිලි හෝ විද්‍යුත් උපදෙස (උපදෙස්) බැංකුව වෙත සැබෑ ලෙස සම්ප්‍රේෂණය නොවීම හේතුවෙන් හෝ යැවීමේ හෝ ලැබීමේ උපකරයෙහි දෝෂයක්, අක්‍රියවීමක් හෝ සූදානම් සහිත නොවීමක් හේතුවෙන් බැංකුව වෙත එම උපදෙස (උපදෙස්) නොලැබීම හේතුවෙන් මාගේ ලිඛිත, දුරකථන, ෆැක්සිමිලි හෝ විද්‍යුත් උපදෙස (උපදෙස්) ප්‍රකාරව ක්‍රියාකිරීමෙන් බැංකුව වැළකී සිටීම; හෝ

(ඇ) බැංකුව විසින් නිශ්චිතව දක්වනු ලබන කාලසීමාව ඇතුළත බැංකුව වෙත ෆැක්සිමිලි උපදෙසෙහි (උපදෙස්වල) සියලු මුල් පිටපත් ඉදිරිපත් කිරීමට මට නොහැකි වීම.

(iii) තොරතුරු ලැබෙන අවස්ථාව වන විට පැවති (අවස්ථානුගත කරුණු පිළිබඳව නොසලකා හරිමින්) තොරතුරු ලබාදෙන හෝ තොරතුරු ලබාදෙන ලෙස සලකනු ලබන තැනැත්තාගේ අධිකාරිබලය හෝ අනන්‍යතාවය විමසා බැලීම සඳහා හෝ ෆැක්සිමිලි හෝ විද්‍යුත් තැපැල මගින් බැංකුව වෙත ලැබෙන උපදෙස්වල හෝ නියෝගවල තත්‍යභාවය හෝ අන්‍යාකාර කරුණක් තහවුරු කරගැනීම සඳහා බැංකුව කිසිදු ආකාරයක වගකීමකට යටත් නොවිය යුතුය. ෆැක්සිමිලි සහ විද්‍යුත් පණිවුඩ ලැබීමේ වේලාව සහ දිනය පිළිබඳ බැංකුවේ තීරණය මම පිළිගනිමි.

(iv) බැංකුව සමග තැන්පත් කර ඇති මාගේ ආදර්ශ අත්සන හෝ මාගේ ඇටෝර්නි බලකරුගේ ආදර්ශ අත්සන සමග අනුකූල වන බවට බැංකුවට පෙනී යන අත්සනක් සහිත යම් ෆැක්සිමිලි උපදෙසක් හෝ නියෝගයක් බැංකුවේ වාසිය පිණිස මාගේ උපදෙසක් හෝ නියෝගයක් ලෙස තීරණාත්මක ලෙස උපකල්පනය කරනු ලැබිය යුතු ය.

(v) මා විසින් නිකුත් නොකරන ලද හෝ මා විසින් බලය පවරනු නොලැබූ එහෙත් මාගේ උපදෙස් හෝ නියෝග ලෙස හෝ මා විසින් බලය පවරන ලද උපදෙස් හෝ නියෝග ලෙස බැංකුව විසින් සද්භාවයෙන් විශ්වාස කර ඇති ෆැක්සිමිලි හෝ විද්‍යුත් උපදෙස් හෝ නියෝග මත බැංකුව විසින් ක්‍රියාකිරීමේදී මා විසින් දරනු ලැබිය හැකි යම් පාඩු සම්බන්ධයෙන් බැංකුව වගකියනු නොලැබිය යුතු ය. එසේ වුවද, බැංකුව විසින් ස්වකීය පරම අභිමතය පරිදි යම් ෆැක්ස්මිලි උපදෙස් හෝ විද්‍යුත් උපදෙස් හෝ නියෝග මත ක්‍රියාකිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(vi) ෆැක්සිමිලි හෝ විද්‍යුත් උපදෙස් හෝ නියෝග පිළිගැනීම සඳහා වූ බැංකුවේ අධිකාරි බලය අඛණ්ඩව ක්‍රියාත්මක වන අධිකාරි බලයක් වන අතර එම අධිකාරී

බලය අවසන් කරන ලෙස බැංකුව වෙත මාගෙන් ලිඛිත නිවේදනයක් ලැබෙන තෙක් එම අධිකාරි බලය අඛණ්ඩව බලාත්මකව පැවතිය යුතු වේ.

(vii) ෆැක්ස්මිලි සම්ප්‍රේෂණ සහ විද්‍යුත් පණිවුඩ, උපදෙස් සහ නියෝග ලබාදීමේ ආරක්ෂක ක්‍රම නොවන බවත් එම ක්‍රමවල අවදානම් පවතින බව මම දැනුවත්ව සිටින බවත් එවැනි ෆැක්ස්මිලි හෝ විද්‍යුත් උපදෙස් සහ නියෝග පිළිගෙන ඒ මත ක්‍රියාකරන ලෙස බැංකුවෙන් මා විසින් කරනු ලබන ඉල්ලීම් මාගේ පහසුව පිණිස වන බවත් ඒ හා සම්බන්ධයෙන් මා විසින් පරම වශයෙන් අවදානම් දරන බවත් මම පිළිගෙන සිටිමි.

4. දුරකථනය /ඊමේල් /ෆැක්සිමිලි හරහා ගිණුම් ශේෂ /ගිණුම් තොරතුරු සැපයීම සම්බන්ධයෙන් වූ හානිපූරණය

(i) බැංකු කාර්යාල වේලාවන් තුළදී දුරකථනයෙන්, ඊමේල් හරහා (අත්සන් කර පරිලෝකනය කරන ලද උපදෙස්) හෝ ෆැක්සිමිලි මගින් ගිණුම් ශේෂය සහ/හෝ මාගේ ගිණුමට (ගිණුම්වලට) හෝ මාගේ නියෝජිතයාට අදාල වෙනත් තොරතුරු ලබාදෙන ලෙස මම බැංකුවෙන් ඉල්ලා සිටිමි. දුරකථනයෙන්, ඊමේල් හෝ ෆැක්සිමිලි මගින් තොරතුරු ලබාගැනීමේ අවදානම පිළිබඳ මම දැන සිටින අතර බැංකුව විසින් ස්වකීය පරම අභිමතය පරිදි එම තොරතුරු මා වෙත/ මාගේ නියෝජිතයන් වෙත සපයනු ලබන බව මම පිළිගෙන සිටිමි.

(ii) ඉහත කී කරුණු සම්බන්ධයෙන් බැංකුවේ ක්‍රියාකාරීත්වය මාගේ පූර්ණ ප්‍රතිලාභය වෙනුවෙන් සහ මාගේ අවදානම් දැරීම සහ වගකීම යටතේ සිදුවන බව මා විසින් මෙයින් පිළිගෙන ප්‍රකාශ කර සිටිනු ලැබේ. මාගේ උපදෙස් හෝ නියෝග බවට හෝ මා විසින් බලය දෙන ලද උපදෙස (උපදෙස්) හෝ නියෝගය (නියෝග) බවට බැංකුව විසින් සද්භාවයෙන් සලකනු ලබන්නා වූ ද, එහෙත් මා විසින් ලබා නොදුන් හෝ මා විසින් ඒ සඳහා බලය ලබා නොදුන් මාගේ උපදෙස (උපදෙස්) හෝ නියෝගය (නියෝග) මත ක්‍රියාකරමින් වුව ද දුරකථනයෙන්, ෆැක්සිමිලි හෝ

ඊමේල් මගින් මා වෙත ගිණුම් ශේෂය/ ගිණුම් විස්තර දැනුම්දීමට අදාලව යම් ගිවිසුමක හෝ තෝරතයක හෝ අන්‍යාකාරයකින් උපචිත වන කිසිදු පාඩුවක්, හෝ අලාභයක් සම්බන්ධයෙන් බැංකුව සහ/හෝ එහි සේවානියුක්තිකයන් වගකීමට බැඳී නොසිටිය යුතු වේ.

(iii) ඉහත කී ආකාරයෙන් එම පහසුකම/ සේවාව අනුව ලබාදෙන/ ලබාදෙන බවට සලකනු ලබන උපදෙස (උපදෙස්) බැංකුව විසින් පිළිගැනීම හෝ එම උපදෙස් ක්‍රියාත්මක කිරීම සලකා බැලීමේ දී, එම පහසුකම/සේවාව මගින් ලබාදෙන හෝ ලබා දෙන බවට සලකනු ලබන යම් උපදෙසක් (උපදෙස්) බැංකුව විසින් පිළිගැනීම හෝ ක්‍රියාත්මක කිරීම හේතුවෙන් බැංකුව විසින් අවස්ථාවෝචිත පරිදි සිදුකරන ලද/ බැංකුවට එරෙහිව ලබාදෙන හෝ බැංකුව විසින් විඳින ලද/ දරන ලද සියලු නිවේදන, ඉල්ලීම්, හිමිකම්පෑම්, නඩු හෝ නඩුකටයුතු මෙන්ම සියලු අලාභ, පාඩු, පිරිවැය, ගාස්තු සහ වියදම් ඇත්නම් ඒ සියල්ලෙන් මා විසින් බැංකුව නිදහස් කර හානිපූරණය කර තබනු ලැබේ.

5. තැපැල් අයිතම රඳවා තබාගෙන සිටීම

(i) මා විසින් මෙම සේවය සඳහා ඉල්ලීමක් කරනු ලැබීමේ දී බැංකුව විසින් ස්වකීය අභිමතය පරිදි මා වෙත යොමු කරන ලද සියලු තැපැල් අයිතම ලැබීමේ දින සිට උපරිම වශයෙන් මාස දෙකක (02) කාලසිමාවක් රඳවා තබාගෙන සිටිනු ලැබිය හැකි අතර එවැනි තැපැල් අයිතම මා වෙත ලැබී ඇති ලෙස සලකනු ලැබිය යුතුය. බැංකුව වෙත ලිඛිතව මා විසින් පටහැනි උපදෙස් ලබා දී ඇත්නම් මිස, එසේ දරන ලද එම තැපැල් අයිතම මා විසින් පුද්ගලිකව හෝ යම් බලයලත් තැනැත්තකු මගින් භාරගනු ලැබේ. මෙම සේවය සඳහා සාධාරණ ගාස්තුවක් අයකිරීමට හා බැංකුව විසින් යෝග්‍ය බවට සලකනු ලබන ආකාරයට එම තැපැල් අයිතම රඳවා තබාගැනීම, විවෘත කිරීම සහ/ හෝ පාලනය කිරීම සඳහා බැංකුව වෙත බලය පවරා සිටිනු ලැබේ. එවැනි යම් තැපැල් අයිතම මාස දෙකක් (02) ඇතුලත ලබාගැනීමට මා හට නොහැකි වුවහොත්, මාගේ අවදානම් දැරීම සහ පිරිවැය දැරීම යටතේ බැංකුව

වෙත අවසන්වරට වාර්තා කර ඇති ලිපිනය හරහා එම තැපැල් අයිතම බැංකුව විසින් මා වෙත ආපසු භාරදෙනු ලැබිය හැකි අතර එසේ ක්‍රියාකිරීමේ දී සියලු වගකීම් හෝ බැඳීම්වලින් බැංකුව නිදහස් කර තබනු ලැබිය යුතුය.

(ii) මා විසින් යම් තැපැල් අයිතම එක්රැස් කරගනු ලබන තෙක් එම තැපැල් අයිතමවල අන්තර්ගතය පිළිබඳ මා වෙත කිසිදු දැනීමක් නොතිබුණි වුව ද සහ මෙහි නෛතික ප්‍රතිවිපාක හෝ බැංකුව සමග පවතින මාගේ අයිතිවාසිකම්වලට බලපෑමක් සිදුවුව ද, එවැනි ප්‍රතිවිපාක පිළිබඳ අවදානම මා විසින් භාරගෙන සිටිනු ලැබේ.

(iii) බැංකුව විසින් දරනු ලබන තැපැල් අයිතමවල අන්තර්ගත කරුණු පිළිබඳ මාගේ නොදැනුවත්භාවය සියලු කාර්ය සඳහා සහ බැංකුව සමග මාගේ ගිණුම (ගිණුම්) අවසන් කිරීමට පෙර හෝ ඉන්පසුව සියලු අධිකරණවලදී බැංකුවේ හිමිකම්වලට එරෙහිව වූ විත්තිවාචකයක් නොවන මෙන්ම අනාගතයේ එසේ විත්තිවාචකයක් නොවනු ඇත.

6. හිලව් කිරීමේ සහ ඒකාබද්ධ කිරීමේ අයිතිවාසිකම්

බැංකුව විසින් ඕනෑම අවස්ථාවක දී සහ කලින් කල වෙන් වෙන්ව හෝ වෙනත් යම් තැනැත්තකු සමග ඒකාබද්ධව බැංකුව සමග පවතින මාගේ සියලු හෝ යම් ගිණුමක් (ගිණුම්) සහ වගකීම්, නිවේදනය කිරීමකින් තොරව බැංකුව විසින් ඒකාබද්ධ කිරීම හෝ මූලික හෝ ඇපකර වශයෙන් හෝ සැබෑ හෝ අවිනිශ්චිත, මූලික හෝ සම්පාර්ශ්වික, වෙන්වෙන්ව හෝ වෙනත් යම් තැනැත්තකු සමග ඒකාබද්ධව වූ බැංකුව වෙත පවතින මාගේ වගකීම් ගෙවා නිරාකරණය කිරීම සඳහා (කල්පිරුණු හෝ එසේ කල්නොපිරුණු) බැංකුව සමග පවතින මාගේ තැන්පත් ද ඇතුලුව ගිණුමේ (ගිණුම්වල) බැරට පවතින සියලු හෝ යම් මුදල් බැංකුව විසින් හිලව් කිරීම කරනු ලැබිය හැකි අතර බැංකුව විසින් තත්කාලයේ පවතින බැංකුවේ හුවමාරු අනුපාතිකය යටතේ යම් අවශ්‍ය ව්‍යවහාර මුදල් පරිවර්තන කටයුතු ද සිදු කළ හැකිය. මාගේ මරණය හෝ බංකොලොත්භාවය සිදුවීම මගින් බැංකුවේ අයිතිවාසිකම්වලට බලපෑමක් නොවිය යුතුය.

7. හානිපූරණය

බැංකුව විසින් බැංකු පහසුකම් සැපයීමේ දී; හෝ යම් ගිණුමක් (ගිණුම්) සම්බන්ධයෙන් හෝ පොදුවේ මෙම නියම හා කොන්දේසි සම්බන්ධයෙන් හෝ මෙම නියම හා කොන්දේසි බලාත්මක කිරීමේ දී සහ බැංකුවට ලැබිය යුතු මුදල් අයකර ගැනීමේ දී හෝ ඕනෑම ආකාරයක නෛතික කටයුත්තක දී බැංකුව විසින් දරන ලද මුදල් අයකර ගැනීමේ දී ඕනෑම ආකාරයකින් උපචිතවන (නෛතික ගාස්තු ද ඇතුලුව) සියලු පිරිවැය සහ වියදම්වලට එරෙහිව බැංකුව සම්පූර්ණයෙන් හානිපූරණය කර තැබීමට මම එකඟ වෙමි.

8. අත්හැරීම්

යම් අවස්ථාවක් හෝ සිදුවීමක් සම්බන්ධයෙන් මෙම නියම සහ කොන්දේසි කිසිවක් බැංකුව විසින් ඉවසා දරා සිටීම, අතපසුකිරීම හෝ අත්හැරීම එම නියම හා කොන්දේසි දැඩි ලෙස බලාත්මක කිරීම සඳහා ඉන්පසුව වූ බැංකුවේ අයිතියට අගතිගාමී නොවිය යුතුය. බැංකුව විසින් සිදුකරනු ලබන කිසිදු අත්හැරීමක් ලිඛිතව සිදුකරන්නේ නම් මිස බලාත්මක නොවිය යුතුය.

9. නිවේදන

මෙම නියම හා කොන්දේසිවල අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට මිස, මෙම නියම හා කොන්දේසි යටතේ හෝ බැංකු පහසුකම් සඳහා වූ යම් ඉල්ලීමකට අනුව බැංකුව විසින් ඉදිරිපත් කරනු සෑම ඉල්ලීමක්ම හෝ සන්නිවේදනයක්ම ලිඛිතව විය යුතු මෙන්ම (ඩිජිටල් ආකාරයෙන් හෝ අන්‍යාකාරයකින් ලිඛිතව) මා විසින් එම ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති ලිපිනයට යොමු කරනු ලැබිය යුතු අතර, පසුව මා විසින් වෙනත් ලිපිනයක් ලිඛිතව නිවේදනය කර ඇත්නම් මිස, එසේ යොමු කල එම ඉල්ලීම හෝ සන්නිවේදනය මා වෙත ලැබී ඇති ලෙස සලකනු ලැබිය යුතුය.

10. විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්/ ගණුදෙනු

(i) විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් (ගිණුම්) විවෘත කිරීම සඳහා කලින් කල විදේශ විනිමය දෙපාර්තමේන්තුව සහ/හෝ එවැනි අධිකාරියක් විසින් නියම කරනු ලබන නිශ්චිත තොරතුරු සහිත ලිපිලේඛන අවශ්‍ය බව ගිණුම්හිමියා විසින් අවබෝධකරගෙන සිටිනු ලැබේ. එසේ නියම කරනු ලබන නිශ්චිත ලිපිලේඛන බැංකුව සමග ගිණුමක් (ගිණුම්) විවෘත කිරීමට පෙරාතුව මා විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(ii) ඉදිරි වෙන්කිරීමේ ගනුදෙනු සහ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම (ගිණුම්) ඇතුලු විදේශ සංචාර කාඩ්පත් (FTC) නිකුත් කිරීම, විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු නිකුත් කිරීම, ශ්‍රී ලංකා රුපියල් ගිණුම/ ගිණුම් සඳහා සහ එවැනි ගිණුම/ ගිණුම් වලින් ප්‍රතිමුඛ ප්‍රේෂණ සහ ආමුඛ ප්‍රේෂණ සිදු කිරීම සහ විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු සිදුකිරීම, බැංකුව විසින් වගකීමට හෝ බැඳීමට යටත් නොවන්නා වූ ද, පූර්ව නිවේදනයකින් තොරව කලින් කල වෙනස් විය හැකි විදේශ විනිමය දෙපාර්තමේන්තුව සහ/හෝ එවැනි යම් අධිකාරියක් විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ මගින් පොදුවේ පාලනය කරනු ලබන බවට ද මා විසින් අවබෝධකරගෙන සිටිනු ලැබේ.

(iii) ඉදිරි වෙන් කිරීමේ ගනුදෙනු ඇතුලුව විදේශ ව්‍යවහාර මුදලින් පවත්වාගෙන යනු ලබන ගිණුමක් (ගිණුම්) සහ/හෝ විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු වලට ආශ්‍රිත අවදානම් තිබිය හැකි බව මම පිළිගෙන සිටිමි. ඒ අනුව, එවැනි යම් ගිණුමක් (ගිණුම්) සහ/හෝ විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනුව (ගනුදෙනු) සම්බන්ධයෙන් උපචිත වන ජාත්‍යන්තර හෝ දේශීය නෛතික හෝ නියාමන සීමා කිරීම් ඇතුලුව ඊට සීමා නොවන්නා වූ ඕනෑම ආකාරයකින් උපචිත වන සියලු අවදානම් සහ පිරිවැය මෙන්ම වියදම් සඳහා මම පරම වශයෙන් බැඳී සිටින බවට මම පිළිගෙන සිටින අතර එවැනි බැංකු ගනුදෙනුවලින් උපචිත වන යම් පාඩු හෝ අලාභවලට එරෙහිව බැංකුව හානිපූරණය කර තැබීමට මම එකඟ වෙමි. එම ගිණුම (ගිණුම්)

මත මුදල් ආපසු ගැනීම් හෝ ගනුදෙනු කටයුතු ද බැංකුවේ අදාල ශාඛාවේ පවතින අදාල ව්‍යවහාර මුදල් සඳහා යටත් වේ. එක් ව්‍යවහාර මුදලකින් තවත් ව්‍යවහාර මුදලකට මුදල් පරිවර්තනය කිරීම බැංකුව විසින් කලින් කල (ස්වකීය පරම අභිමතය පරිදි) තීරණය කරනු ලබන විනිමය අනුපාතිකය අනුව සිදුකරනු ලැබේ.

11. නාමයෝජනා

නාමයෝජනා පිළිබඳ නියම හා කොන්දේසි වෙනම ලේඛනයක් වන්නා වූ නාමයෝජනා ආකෘති පත්‍රයේ නිශ්චිතව දක්වා ඇත

.

12. ඇමරිකා එක්සත් ජනපදයේ විදේශ ගිණුම් බදු අනුකූලතා පනත (FATCA)

තොරතුරු හෙලිදරව් කිරීම සඳහා වූ නියම කිරීම් සමග එකඟව ක්‍රියාකිරීමේ වගකීමක්/ බැඳීමක් බැංකුව වෙත පනවා ඇති අවස්ථාවක දී, මා විසින් විවෘත කරනු ලබන/ පවත්වාගෙන යනු ලබන/ සිදු කරන සහ/හෝ වසාදමනු ලබන ගිණුමක් (ගිණුම්) පිළිබඳ සියලු තොරතුරු මාගෙන් විමසීමෙන් පසුව හෝ එසේ විමසීමකින් තොරව ඇමරිකා එක්සත් ජනපදයේ අභ්‍යන්තර ආදායම් සේවය (IRS) වෙත හෝ ඇමරිකා එක්සත් ජනපදයේ වෙනත් යම් නියාමන අධිකාරියක් හෝ වෙනත් යම් කලාපයක් වෙත වාර්තා කිරීම සඳහා මා විසින් බැංකුව වෙත මෙයින් බලය පවරා සිටිනු ලැබේ.

මෙම කැමැත්ත (සංශෝධිත) ශ්‍රී ලංකාවේ 1988 අංක 30 දරන බැංකු පනතේ 77 වන වගන්තියේ විධිවධාන ප්‍රකාරව ප්‍රදානය කරනු ලැබේ.

මාගෙන් තවදුරටත් කැමැත්ත ලබා ගැනීමෙන් තොරව වෙනත් කලාපයක්/කලාප විසින් පනවා ඇති/ හෝ පනවනු ලැබිය හැකි FATCA විධිවිධාන යටතේ හෝ වෙනත් යම් නියෝගයක්/ නියෝග යටතේ අවශ්‍යවේ නම් මාගේ ගිණුමෙන් (ගිණුම්වලින්) මුදල් හරකිරීම මගින් IRS වෙත ගෙවනු ලැබිය යුතු බදු සහ/හෝ ගාස්තු ප්‍රේෂණය කිරීම සඳහා බැංකුව වෙත මෙයින් තවදුරටත් බලය පවරනු ලැබේ.

මාගේ පදිංචිය/ පුරවැසිභාවය පිළිබඳ අනාගතයේදී යම් වෙනස්කමක් සිදුවුවහොත් ඒ පිළිබඳව බැංකුව වෙත දැනුම් දෙන බවට මා විසින් මෙයින් ප්‍රතිඥාදී සිටිනු ලැබේ.

13. පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාකිරීම

බැංකුවේ නිල වෙබ් අඩවියේ හෝ වෙනත් යම් නිල ප්‍රකාශනයක හෝ බැංකුවේ නිවේදනයක සඳහන් කාර්ය පටිපාටිය ප්‍රකාරව ප්‍රසිද්ධ කර ඇති ආකාරයට බැංකුව වෙත බැංකුවේ සමීපතම ශාඛාව හෝ බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය හෝ ප්‍රධාන කාර්යාලය වෙත වාචිකව හෝ ලිඛිතව ඕනෑම පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම සඳහා ගිණුම් හිමියාට අයිතියක් ඇත්තේ ය. යම් පැමිණිල්ලක් විසඳා නොමැති අවස්ථාවක දී, ගිණුම්හිමියා විසින් මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා හරහා ඒ සඳහා සහනයක් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

14. පැවරීම

ගිණුම් හිමියාගෙන් (ගිණුම් හිමියන්ගෙන්) තත්කාර්ය සඳහා පූර්ව අනුමතය ලබාගැනීමෙන් තොරව, මේ යටතේ වූ බැංකුවේ යම් හෝ සියලු අයිතිවාසිකම් වෙනත් යම් පාර්ශවයක් වෙත පවරා දීමේ අයිතිය බැංකුව සතුවේ.

15. E - ප්‍රකාශන

(i) e - ප්‍රකාශනයක් ලබාගැනීමේ කාර්ය සඳහා බැංකුව වෙත නිවැරදි ඊමේල් ලිපිනයක් ලබාදීම සම්බන්ධයෙන් මම පරම වශයෙන් වගකියනු ලබන බවටත්, ඉන්පසුව නිදහස් කරනු ලබන ඇඩෝබි ඇක්‍රොබෙට් 6 වන සංස්කරණය හෝ සංස්කරණ මා විසින් e - ප්‍රකාශන වෙත ප්‍රවේශවන්නා වූ මාගේ උපාංග මත ස්ථාපනය කරනු ලැබිය හැකි බවත් බාධාවකින් තොරව e -ප්‍රකාශනයක් ලබාගැනීම සහතික කිරීම සඳහා තැපැල් බහාලුම නිතරම පැහැදිලි කර තබනු ලබන බවටත් මම සහතික කර සිටිමි.

(ii) යම් වෙනසක් සිදුවන අවස්ථාවක දී, බැංකුව වෙත අලුත් ඊමේල් ලිපිනයක් සැපයීම සඳහා මම එකඟ වෙමි.

16. SMS සංඥා

(i) බැංකුව/ NDB බැංකුව විසින් සේවා සඳහා ලියාපදිංචිවී ඇති (ගනුදෙනුකරුවන් යනුවෙන් හඳුන්වන) ස්වකීය ගනුදෙනුකරුවන් සඳහා ලබාදී ඇති SMS සංඥා සේවය (සේවා) භාවිත කිරීම සියලු අවස්ථාවලදී බැංකුවේ නිශ්චිත නියම හා කොන්දේසි මගින් පාලනය වේ. මෙම සේවා සඳහා ප්‍රවේශවීමට බැංකුව සමග ලියාපදිංචි වී ඇති අංකය සහිත ස්වකීය ජංගම දුරකථනය පමණක් ගනුදෙනුකරු විසින් භාවිත කරනු ලැබිය යුතු වේ. ගණුදෙනුකරු විසින් සියලු අවස්ථාවල දී සිම් කාඩ්පත සහ ජංගම දුරකථනය තමාගේ සන්තකයේ තබාගත යුතු වේ. ගනුදෙනුකරු විසින් බැංකුවේ නියම සහ කොන්දේසි සමග අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවකදී සිදුවන සියලු ප්‍රතිවිපාක සම්බන්ධයෙන් ගනුදෙනුකරු පරම වශයෙන් වගකියනු ලැබිය යුතු වේ. සපයා ඇති ජංගම දුරකථන අංකය (අංක) පිළිබඳ යම් වෙනසක් සිදුවුවහොත්, එම වෙනස්කම් පිළිබඳව ගනුදෙනුකරු විසින් බැංකුව දැනුවත් කරනු ලැබිය යුතුය.

(ii) SMS සංඥා සේවය හරහා ගනුදෙනුකරුවන් වෙත පිරිනමනු ලබන සේවා තීරණය කිරීමේ අයිතිය බැංකුව වෙත රඳවා තබා ගනු ලැබේ.

(iii) බැංකුවේ පරම අභිමතය පරිදි වෙනස් කරනු ලැබිය හැකි වූ එක් එක් බැංකු සේවය වෙනුවෙන් බැංකුව විසින් අර්ථනිරූපණය කරනු ලබන අවම ගනුදෙනු සීමාවක් මත පදනම්ව ගනුදෙනුකරු වෙත SMS සංඥා එවනු ලැබේ.

(iv) NDB ඇමතුම් මධ්‍යස්ථානය ඇමතීම මගින් ගනුදෙනුකරු විසින් සිදුකරනු ලබන ඉල්ලීමක් මගින් ඕනෑම අවස්ථාවක දී සේවය අවසන් කරනු ලැබිය හැකි ය. එවැනි සෑම අවසන් කිරීමක්ම වහාම බලාත්මක විය යුතුය.

(v) බැංකුව විසින් තීරණය කරනු ලබන කාලසීමාවක් තුළදී බැංකුව විසින් බැංකු ගිණුම් ගනුදෙනු සඳහා ලැබෙන SMS සංඥා සේවය සඳහා වූ දායක මුදල් ගාස්තුව ගනුදෙනුකරුගේ මූලික පුද්ගල ගිණුමෙන් හර කරනු ලැබේ.

17. NDB ඩෙබිට් කාඩ්පත් පාලනය කරනු ලබන නියම සහ කොන්දේසි

(i) අන්‍යාකාරයකින් ප්‍රකාශකර ඇත්නම් මිස, 18 වන වගන්තියේ භාවිත කර ඇති යෙදුම් සඳහා නියම හා කොන්දේසිවල ලබා දී ඇති අර්ථයම තිබිය යුතුය.

(අ) "ATM" යන්ත්‍රය යන්නෙන් NDB ඩෙබිට් කාඩ්පත ජාත්‍යන්තර වශයෙන් පිළිගනු ලබන සියලු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර අදහස් වේ.

(ආ) "කාඩ්පත් හිමියා" යන්නෙන් මැන්ඩේට්පත්‍රය ප්‍රකාරව එහි සඳහන් පරිදි ගිණුම පාලනය කිරීම සඳහා බලය පවරා ඇති යම් තැනැත්තකු හෝ තැනැත්තන් අදහස් වේ.

(ඇ) "කාඩ්පත් පහසුකම" යන්නෙන් ATM ගනුදෙනු සහ සියලු ආශ්‍රිත කරුණු අදහස් වේ.

(ඈ) "කාඩ්පත් ගනුදෙනුව/ ගනුදෙනු" යන්නෙන් ATM යන්ත්‍ර සහ POS පර්යන්ත හරහා සකස් කිරීමේ හැකියාව පවතින සියලු ගනුදෙනු අදහස් වේ.

(ඉ) "NDB ඩෙබිට් කාඩ්පත" යන්නෙන් යම් අලුත් කිරීමේ හෝ ප්‍රතියෝජන කාඩ්පතක් ද ඇතුලුව ATM යන්ත්‍ර සහ POS හරහා ව්‍යාපාර කටයුතු සිදුකිරීම සඳහා යම් කාඩ්පත් හිමියකුට බැංකුව විසින් නිකුත් කරනු ලබන VISA කාඩ්පත හෝ වෙනත් වෙළඳ නාමයක් යටතේ නිකුත් කරන ලද වෙනත් යම් කාඩ්පතක් අදහස් වේ.

(ඊ) “PIN අංකය” යන්නෙන් NDB ඩෙබිට් කාඩ්පත නිකුත් කරනු ලබන අවස්ථාවේ දී බැංකුව විසින් කාඩ්පත් හිමියාට නිකුත් කරනු ලබන පුද්ගල හඳුනාගැනීමේ අංකය හෝ NDB ඩෙබිට් කාඩ්පත් ගණුදෙනුවලට අදාලව කාඩ්පත්හිමියා හඳුනා ගැනීම සඳහා බැංකුව සමග සකස්කර ගනු ලබන කාඩ්පත්හිමියා විසින් පසුව ආදේශ කරනු ලබන යම් අංකයක් අදහස් වේ.

(උ) “POS” යන්නෙන් NDB ඩෙබිට් කාඩ්පත පිළිගනු ලබන ලෝකය පුරා සිටින වෙළඳුන් සමග පවතින අලෙවි පර්යන්ත ස්ථාන අදහස් වේ.

(ii) ATM යන්ත්‍රවලින් මුදල් ආපසු ගැනීම සඳහා කාඩ්පත්හිමියා විසින් PIN අංකය ද සමගින් ඒකාබද්ධව NDB ඩෙබිට් කාඩ්පත භාවිත කරනු ලැබිය හැකි ය. කාඩ්පත්හිමියා විසින් එසේ ආපසු ලබාගන්නා මුදල ගිණුමෙන් හරකරනු ලැබේ.

(iii) අදාල මුදල ගිණුමෙන් හරකරනු ලබන්නා වූ පරිදි මුදල් ආපසු ලබාගැනීම සඳහා NDB ඩෙබිට් කාඩ්පත පිළිගනු ලබන ඕනෑම බැංකුවක දී හෝ වවුචරයක් අත්සන් කිරීම මගින් බලයලත් ආයතනවලින් භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීම සඳහා කාඩ්පත් හිමියා විසින් NDB ඩෙබිට් කාඩ්පත භාවිත කරනු ලැබිය හැකිය.

(iv) කාඩ්පත් හිමියකුට කාඩ්පත් පහසුකම ප්‍රදානය කිරීම බැංකුවේ පරම අභිමතය පරිදි සිදුවන අතර කාඩ්පත් පහසුකම හරහා සිදු කරනු ලබන සියලු කාඩ්පත් ගනුදෙනු සම්බන්ධයෙන් වූ අවදානම් පිළිබඳව සියලු අවස්ථාවල දී කාඩ්පත්හිමියා වගකියනු ලැබිය යුතුය. කාඩ්පත් පහසුකම ආරම්භයේ දී මාස හැටක් (60) නොඉක්මවන කාලසීමාවක් සඳහා ප්‍රදානය කරනු ලබන අතර එම කාලසීමාව අවසානයේ දී බැංකුවේ පරම අභිමතය පරිදි නැවත අලුත් කරනු ලැබිය හැකි ය. එසේ වුව ද, කාඩ්පත් ආපසු ලබාගැනීම මගින්, අවලංගු කිරීම මගින් හෝ NDB ඩෙබිට් කාඩ්පත අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම මගින් ඕනෑම අවස්ථාවක දී පූර්ව නිවේදනයකින් තොරව සහ කාඩ්පත් හිමියා වෙත තත්කාර්ය සඳහා හේතු දැක්වීමකින් තොරව කාඩ්පත් පහසුකම අවසන් කිරීමේ නිදහස බැංකුව සතු වේ.

(v) කාඩ්පත්හිමියා විසින් බැංකුව වෙත දින හතකට (07) අඩුනොවන කාලයක් සඳහා පූර්ව ලිඛිත නිවේදනයක් ලබාදීම මගින් බැංකුව වෙත වහාම NDB ඩෙබිට් කාඩ්පත් ආපසු භාර දී ඒ සඳහා වලංගු රිසිට්පතක් ලබාගෙන ස්වකීය අභිමතය පරිදි කාඩ්පත් පහසුකම අවලංගු කරනු ලැබිය හැකිය.

(vi) NDB ඩෙබිට් කාඩ්පත සියලු අවස්ථාවල දී බැංකුවේ දේපළක් වශයෙන් පැවතිය යුතු අතර කාඩ්පත් පහසුකම භාවිත කිරීම සඳහා බැංකුව විසින් බලය පවරා ඇත්තා වූ කාඩ්පත්හිමියා විසින් එම ඩෙබිට් කාඩ්පත පිටපත් කිරීම සඳහා හෝ එවැනි පිටපත් කිරීමක් අනුගමනය කිරීම සඳහා උත්සාහ නොකළ යුතුය.

(vii) ගිණුම (ගිණුම්) වසාදමා ඇත්නම් සහ/හෝ කාඩ්පත්හිමියා මියගොස් ඇත්නම් හෝ බැංකුව විසින් NDB ඩෙබිට් කාඩ්පත ආපසු භාරදෙන ලෙස කාඩ්පත් හිමියාට නියම කර ඇති අවස්ථාවක දී, NDB ඩෙබිට් කාඩ්පත ආපසු ඉල්ලා සිටීම/ ආපසු ලබාගැනීම සඳහා බැංකුවට හිමිකමක් ඇත්තේය.

(viii) බැංකුව සමග පවත්වාගෙන යනු ලබන ගිණුම යම් හේතුවක් නිසා වසා දමා ඇති අවස්ථාවකදී, බැංකුව විසින් හෝ බැංකුව වෙනුවෙන් ක්‍රියාකරනු ලබන යම් තැනැත්තකු විසින් NDB ඩෙබිට් කාඩ්පත අවලංගු කර ආපසු ඉල්ලා සිටීමේ නිවේදනයක් ලබාදීමෙන් පසුව සහ එය අවලංගු කිරීම සඳහා ආපසු ලබාදෙන ලෙස ඉල්ලා සිටිනු ලබන අවස්ථාවක දී, කාඩ්පත් හිමියා විසින් NDB ඩෙබිට් කාඩ්පත භාවිත කිරීමෙන් හෝ භාවිත කිරීමට උත්සාහ කිරීමෙන් වැළකී සිටින බවට එකඟව සිටිනු ලැබේ. PIN අංකය NDB ඩෙබිට් කාඩ්පත භාවිත කිරීමේ කාර්ය සඳහා නිකුත් කරනු ලැබ ඇති අතර එම කාර්ය සඳහා ආදේශ කරනු ලබන අංකය (අංක) දැඩි ලෙස රහසිගත වේ. ස්වේච්ඡාවෙන් හෝ අනායාකාරයකින් කිසිදු අවස්ථානුගත කරුණක් යටතේ හෝ කිසිදු ක්‍රමයකින් PIN අංකය යම් තුන්වන පාර්ශවයක් වෙත හෙළිදරව් නොකළ යුතුය. NDB ඩෙබිට් කාඩ්පත යම් තුන්වන පාර්ශවයක් විසින් භාවිතා කිරීමේ හැකියාව ලැබෙන පරිදි කාඩ්පත්හිමියා

විසින් කිසිදු ස්ථානයක හෝ කිසිදු ක්‍රමයකින් PIN අංකය පිළිබඳ කිසිදු ලිඛිත වාර්තාවක් පවත්වාගෙන නොයා යුතුය.

(ix) NDB ඩෙබිට් කාඩ්පත භාවිත කිරීම මගින් ඕනෑම ආකාරයකින් සිදුවන කාඩ්පත් ගනුදෙනු සම්බන්ධයෙන් කාඩ්පත්හිමියා සියලු අවස්ථාවලදී වගකීමට බැඳී සිටිය යුතු අතර NDB ඩෙබිට් කාඩ්පත අනවසරයෙන් භාවිත කිරීම හෝ අදාල PIN අංකය භාවිත කිරීම මගින් උපචිත වන සියලු පාඩු/අලාභ සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා විසින් බැංකුව හානිපූරණය කර තැබිය යුතුය.

(x) කාඩ්පත ලබා දී ඇත්තේ යම් කාඩ්පත් හිමියකු වෙත ද එම කාඩ්පත් හිමියා විසින් පමණක් කාඩ්පත් පහසුකම භාවිත කරනු ලැබිය යුතු අතර NDB ඩෙබිට් කාඩ්පතේ සපයා ඇති ස්ථානයෙහි කාඩ්පත්හිමියා විසින් ස්වකීය අත්සන තබනු ලැබිය යුතුය. ඔහු විසින් NDB ඩෙබිට් කාඩ්පත නැතිවීම/ සොරකමකට ලක්වීම වැළැක්වීම සඳහා සහ එහි PIN අංකය පිළිබඳව අනවසර තැනැත්තකු විසින් දැනුවත් වීම වැළැක්වීම සඳහා සියලු අවස්ථාවලදී හැකිතාක් දුරට නිසි උද්යෝගයෙන් ක්‍රියාකළ යුතුය. එවැනි ඕනෑම අවස්ථාවක දී කාඩ්පත්හිමියා විසින් ඒ පිළිබඳව වහාම බැංකුව වෙත දැනුම් දිය යුතුය. PIN අංකය නැතිවීම/ සොරකම් කිරීම හෝ අනවසරයෙන් භාවිත කිරීම පිළිබඳ බැංකුව වෙත තොරතුරු ලැබී ඇති බව බැංකුව විසින් කාඩ්පත්හිමියා වෙත තහවුරු කරනු ලබන තෙක්, NDB ඩෙබිට් කාඩ්පත භාවිත කිරීම මගින් සිදුවන කාඩ්පත් ගනුදෙනු සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා සම්පූර්ණ වගකීම භාරගනු ලැබිය යුතුය.

(xi) කාඩ්පත් හිමියා විසින් බැංකුව සමග එකඟ වූ අයිරා සීමාව හෝ ගිණුමේ (ගිණුම්වල) පවතින අරමුදල් ප්‍රමාණය ඉක්මවමින් NDB ඩෙබිට් කාඩ්පත භාවිත කිරීම මගින් කිසිදු ආකාරයකින් NDB ඩෙබිට් කාඩ්පතට සම්බන්ධකර ඇති ස්වකීය ගිණුමෙන් (ගිණුම්වලින්) වැඩිපුර මුදල් ලබාගැනීම හෝ අරමුදල් ලබාගැනීම/ හුවමාරු කිරීම හෝ ගනුදෙනු කිරීම සිදුනොකළ යුතුය.

(xii) කාඩ්පත් හිමියකු සඳහා නිකුත් කරන ලද NDB ඩෙබිට් කාඩ්පත සහ PIN අංකය පවරනු නොලැබිය හැකි අතර එය ස්වකීය පරම භාවිතය සඳහා පමණක් වේ. PIN අංකය දැඩිලෙස රහසිගතව තබා ගැනීම සඳහා කාඩ්පත්හිමියා වගකිවයුතු අතර කිසිදු අවස්ථානුගත කරුණක් යටතේ කිසිදු අවස්ථාවකදී ස්වකීය PIN අංකය වෙනත් කිසිදු තැනැත්තකු වෙත හෙළිදරව් නොකරන බවට කාඩ්පත්හිමියා විසින් ප්‍රතිඥාදී සිටිනු ලැබේ.

(xiii) කාඩ්පත්හිමියාගේ දැනුම හෝ අවසරය ඇතිව හෝ නොමැතිව NDB ඩෙබිට් කාඩ්පත භාවිත කිරීම මගින් කරනු ලබන මුදල් ආපසු ගැනීම්/ පැවරීම්/ ගෙවීම් සම්බන්ධයෙන් වූ මුදල්, ගිණුම් හිමියාගේ නම්කල ගිණුමෙන් (ගිණුම්වලින්) හරකර ගැනීම සඳහා බැංකුවට බලය පවරා සිටිනු ලැබේ. එසේ වුව ද, යම් දිනයක දී සිදු කරනු ලබන ගනුදෙනුවල සම්පූර්ණ ප්‍රමාණය කලින් කල බැංකුව විසින් කාඩ්පත්හිමියා වෙත නිවේදනය කරනු ලබන යම් මුදල් ප්‍රමාණයකට සහ යම් කොන්දේසිවලට සීමාවිය යුතුය.

(xiv) ඉහතකී සීමාව පිළිබඳ නොසලකා හරිමින්, NDB ඩෙබිට් කාඩ්පත මගින් හෝ වෙනත් යම් දේශීය ජාලයක් හරහා දේශීය වශයෙන් හෝ ජාත්‍යන්තර වශයෙන් සිදුකරනු ලබන කාඩ්පත් ගනුදෙනුවලට අදාල නෛතික සහ ව්‍යවස්ථාපිත ගාස්තු ද ඇතුලු සියලු ගාස්තු කාඩ්පත් හිමියාගේ නම්කල ගිණුමෙන් (ගිණුම්වලින්) හරකර ගැනීම සඳහා බැංකුව වෙත බලය පවරා සිටිනු ලැබේ.

(xv) බැංකුව විසින් අයකරනු ලබන යම් අතිරේක ප්‍රතිශතයක් සමග සහ VISA ඉන්ටර්නැෂනල් විසින් බැංකුවෙන් අයකරනු ලබන කාඩ්පත් ගනුදෙනු ගාස්තුව (ගාස්තු) සමග මුදල් පරිවර්තනය කරනු ලබන දිනයේ දී VISA ඉන්ටර්නැෂනල් විසින් අනුගමනය කරනු ලබන හුවමාරු අනුපාතිකය මගින් නිශ්චය කරනු ලබන යම් විනිමය අනුපාතිකයක් යටතේ ශ්‍රීලංකා රුපියල් බවට පරිවර්තනය කිරීමෙන් පසුව ශ්‍රීලංකා රුපියල් වලින් හැර වෙනත් ව්‍යවහාර මුදල් වලින් සිදුකරනු ලබන සියලු කාඩ්පත් ගනුදෙනු කාඩ්පත් ගිණුමෙන් හරකරනු ලැබේ.

(xvi) කාඩ්පත් ගනුදෙනු අවලංගු කිරීම, ප්‍රත්‍යාවර්තනය කිරීම හෝ ආපසු ලබාදීම හේතුවෙන් සිදුවන යම් හුවමාරු පාඩුවක් සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා වගකියනු ලැබිය යුතුය.

(xvii) ATM තිරයේ දිස්වන හෝ ATM යන්ත්‍රය විසින් නිකුත් කරනු ලබන මුද්‍රිත විමසීම් පත්‍රිකාවේ හෝ රිසිට්පත්‍රයේ සඳහන් වන මුදල ඕනෑම ආකාරයක කාර්යයන් සඳහා බැංකුව සමග පවතින නම්කල ගිණුමේ (ගිණුම්වල) තත්ත්වය පිළිබඳ තීරණාත්මක සාක්ෂියක් ලෙස සලකනු නොලැබිය යුතු බවට ගිණුම්හිමියා පිළිගෙන සිටියි. NDB ඩෙබිට් කාඩ්පත භාවිත කිරීම මගින් සකස් කරනු ලබන කාඩ්පත් ගනුදෙනු පිළිබඳ බැංකු වාර්තාව, 18(xi), 18(xii), 18(xiii) සහ 18(xiv) වගන්තිවලට යටත්ව සියලු කාර්ය සඳහා තීරණාත්මක සහ බැඳීම්සහගත විය යුතුය.

(xviii) NDB ඩෙබිට් කාඩ්පත භාවිත කිරීම මගින් කරනු ලබන ගනුදෙනු පිළිබඳ වාර්තාව කාඩ්පත් හිමියා වෙත යවනු ලබන සාමාන්‍ය බැංකු ප්‍රකාශවල ඇතුළත් කරනු ලැබිය යුතු අතර එම ප්‍රකාශන ගිණුම්හිමියා විසින් පරීක්ෂාකර බැලීමට නියමිත වන අතර එම ප්‍රකාශනවල යම් උද්දේශිත වරදක් ඇත්නම් ඒ පිළිබඳව කාඩ්පත් හිමියා විසින් එම ප්‍රකාශන දිනයේ සිට දින දාහතරක (14) කාලයක් ඇතුළත බැංකුව වෙත නිවේදනය කරනු ලැබිය යුතු අතර එම කාලසීමාවෙන් පසුව එහි සඳහන් ප්‍රකාශනය සහ ඇතුළත් කිරීම් (එසේ නිවේදනය කරන ලද වැරදි හැර) සියලු කාර්ය සඳහා බැංකුව සහ කාඩ්පත්හිමියා අතර වූ නිවැරදි ප්‍රකාශ සහ ඇතුළත් කිරීම් ලෙස තීරණාත්මකව සලකනු ලැබිය යුතුය.

(xix) පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් බැංකුව කිසිදු වගකීමක් භාරගෙන නොසිටියිත එනම්-

(අ) යම් වෙළඳ ආයතනයක් විසින් NDB ඩෙබිට් කාඩ්පත ගරුකිරීම හෝ පිළිගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබීම හෝ ඒ සඳහා අපොහොසත් වීම හෝ සම්පූර්ණ සහ

අවසරලත් සීමාව සඳහා පහසුකම් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ එසේ කිරීමට අපොහොසත් වීම.

(ආ) NDBඩෙබිට් කාඩ්පත භාවිත කිරීම මගින් මිලදී ගනු ලබන හෝ ලබාගන්නා භාණ්ඩ සහ සේවාවල යම් දෝෂයක් හෝ ඌනතාවයක් තිබීම.

(ඇ) NDB ඩෙබිට් කාඩ්පත භාවිත කිරීම මගින් භාණ්ඩ මිලදී ගැනීම හෝ සේවා ලබාගැනීම සඳහා කාඩ්පත් හිමියා දිරිගැන්වීම හෝ උනන්දු කරවනු ලැබීම මගින් යම් වෙළඳ දැන්වීමක, ප්‍රසිද්ධ කිරීමක හෝ ප්‍රවර්ධන සේවයක සිදුවන හෝ අන්තර්ගත වන යම් වැරදි සහගත නියෝජනය කිරීම්,

(ඇ) බැංකුවේ පාලනයෙන් පරිභාහිරව පවතින හේතුවක් නිසා හෝ අන්‍යාකාර හේතුවක් නිසා ATM යන්ත්‍රයක් බිඳවැටීම හෝ අක්‍රීයවීම හෝ දෝෂ සහිත වීම නිසා හෝ එවැනි හේතුවකින් උපචිතවන හෝ සන්නිවේදන පද්ධතියක් හෝ පහසුකම් හෝ දත්ත සැකසුම් පද්ධතියක් හෝ සම්ප්‍රේෂණ සම්බන්ධතාවක් හෝ කාර්මික හෝ වෙනත් යම් ආරවුලක් හෝ වෙනත් හේතුවක් නිසා සිදුවන ඕනෑම ආකාරයක අපහසුතාවයක්, පාඩුවක්, අලාභයක් හෝ අපහසුතාවයකට පත්වීමක්

(xx) NDB ඩෙබිට් කාඩ්පත භාවිත කිරීම මගින් සිදුකරනු ලබන සියලු කාඩ්පත් ගනුදෙනු සියලු අවස්ථාවලදී:-

(අ) (ලෝකය පුරා දේශීය සහ විදේශීය ව්‍යවහාර මුදලින් පුද්ගලික වියදම් සඳහා කාඩ්පත් හිමියා විසින් NDB ඩෙබිට් කාඩ්පත භාවිත කිරීම ඇතුලු ඊට සීමා නොවන්නා වූ) කාඩ්පත් ගණුදෙනු සිදු කරනු ලබන අවස්ථාවේ දී පවතින විදේශ විනිමය නියෝගවලට එකඟ බවට; සහ

(ආ) නෛතික කාර්ය සඳහා, තුන්වන පාර්ශව වෙනුවෙන් කරනු ලබන භාහිර ගෙවීම් මගින් විනිමය පාලන නියෝග උල්ලංඝනය කරමින් සිදුවේ ද යන්න පිළිබඳව;

කාඩ්පත්හිමියා සහතික විය යුතුය.

(xxi) බැංකුව විසින් උචිත බවට තීරණය කරනු ලබන ආකාරයට කලින් කල මෙම නියම හා කොන්දේසි වෙනස් කිරීමේ, විවිධාංගීකරණය කිරීමේ, සංශෝධනය කිරීමේ, ආපසු ලබාගැනීමේ, අලුත් කිරීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය බැංකුව විසින් තමාවෙත රඳවාගනු ලැබේ. කාඩ්පත් හිමියා වෙත ලබාදෙන නිවේදනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි එම වෙනස් කිරීම බලාත්මක වන දිනයෙන් පසුව NDB ඩෙබිට් කාඩ්පත භාවිතකිරීමේදී කාඩ්පත් හිමියා විසින් සීමා කිරීමකින් තොරව එම වෙනස්කම පිළිගෙන ඇති ලෙස සලකනු ලැබිය යුතුය. කාඩ්පත් හිමියා විසින් එම වෙනස් කිරීම පිළිනොගනී නම්, NDB ඩෙබිට් කාඩ්පත බැංකුව වෙත ආපසු භාර දී ඒ සඳහා වලංගු රිසිට්පතක් ලබාගත යුතුය.

(xxii) තත්කාර්ය සඳහා කාඩ්පත් හිමියාගෙන් පූර්ව අවසරයක් ලබාගැනීමෙන් තොරව මේ යටතේ වූ බැංකුවේ යම් හෝ සියලු අයිතිවාසිකම් වෙනත් යම් පාර්ශවයක් වෙත පැවරීමේ අයිතිය බැංකුව සතුවේ.

18. පොදු විධිවිධාන

(i) අදිසි තත්ත්වයන් නිසා ගිවිසුමක් සපුරාලීමට නොහැකි වීමද ඇතුලුව බැංකුවේ පාලනයෙන් පරිභාහිරව පවතින යම් හේතුවක් නිසා (ඍජුව හෝ වක්‍රව) යම් සේවයක් ලබාදීමට නොහැකිවීම හෝ ප්‍රමාද වීම හෝ මේ යටතේ වූ වගකීම් සපුරාලීමට නොහැකි වීම හෝ ප්‍රමාදවීම සම්බන්ධයෙන් බැංකුව වගකීමට බැඳී නොසිටියි.

(ii) බැංකුව විසින් ලබාදෙන නිෂ්පාදන සහ සේවා මෙන්ම ඒවාට අදාළ නියම හා කොන්දේසි සඳහා සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් යමක් එකතු කිරීමේ, ප්‍රතිශෝධනය කිරීමේ, සංශෝධනය කිරීමේ හෝ අවලංගු කිරීමේ අයිතීන් බැංකුව විසින් තමා වෙත රඳවා ගනු ලැබේ. එවැනි යම් එකතු කිරීමක්, ප්‍රතිශෝධනය කිරීමක්,

සංශෝධනය කිරීමක්, අවලංගු කිරීමක් හෝ වෙනස් කිරීමක් බැංකු ශාඛාවල දැන්වීම් පුවරුවල, බැංකුවේ නිල වෙබ් අඩවියේ හෝ පුවත්පත්වල හෝ වෙළඳ දැන්වීම්වල හෝ අන්‍යාකාරයකින් ප්‍රදර්ශනය කිරීම මගින් මාගේ අවධානයට ඉදිරිපත් කළ අවස්ථාවේ සිට බලාත්මක වන මෙන්ම බැඳීම් සහගත වේ.

(iii) මාගේ සහ බැංකුවේ අයිතිවාසිකම් ආරක්ෂාකිරීම වෙනුවෙන් බැංකුව විසින් ලබාගන්නා හෝ බැංකුව වෙත ලැබෙන දුරකථන ඇමතුම් පටිගත කරනු ලැබිය හැකි බවට මම දැනුවත්ව පිළිගෙන සිටිමි.

(iv) (මැන්ඩේට් පත්‍රයේ හෝ අන්‍යාකාරයකින්) බැංකුව වෙත ලබාදී ඇති සියලු තොරතුරු මාගේ දැනීම අනුව සත්‍ය සහ නිවැරදි බවත් මා විසින් ලබාදී ඇති තොරතුරු වැරදි සහගත හෝ අසත්‍ය බවට අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවකදී මැන්ඩේට් පත්‍රය ප්‍රතික්ෂේප කිරීමේ හෝ ගිණුම (ගිණුම්) වසා දැමීමේ අයිතිය බැංකුව වෙත රඳවා තබාගන්නා බවත් මා විසින් මෙයින් සහතික කර සිටිනු ලැබේ.

19. ඩිජිටල් හෝ ඉලෙක්ට්‍රොනික බැංකු කටයුතු

(i) නියම සහ කොන්දේසි යටතේ සහ නියම සහ කොන්දේසි ප්‍රකාරව මා විසින්/අප විසින් විවෘත කරනු ලබන පුද්ගලික ගිණුම් සම්බන්ධයෙන් ලිඛිතව ලබාදීමට නියමිත උපදෙස් සහ/හෝ නිවේදන භෞතික වශයෙන් හෝ ඩිජිටල් වශයෙන් ලබාදිය හැකි බව මම පිළිගෙන දැනුවත්ව සිටිමි.

(ii) ඉලෙක්ට්‍රොනික අත්සන

ඉලෙක්ට්‍රොනික ලෙස ඇතුළත් කරනු ලබන අත්සන මගින් බැංකු ගනුදෙනුවක් ක්‍රියාත්මක කිරීම සඳහා වූ නෛතික බලය පැවරීමක් සංයුක්ත වන බවත් ඉලෙක්ට්‍රෙනික ක්‍රම භාවිත කරමින් ඇතුළත් කරනු ලබන එවැනි අත්සනක නීත්‍යානුකූලභාවය, වලංගුභාවය, බලාත්මකභාවය හෝ ක්‍රියාත්මක කල හැකි බව පිළිබඳව මා විසින් අභියෝගයට ලක් නොකරන බවත් මම මෙයින් පිළිගෙන සිටිමි.

ශ්‍රී ලංකාවේ නීතිය මගින් ඉලෙක්ට්‍රොනික අත්සන් සඳහා නෛතික පිළිගැනීමක් ලබා දී ඇති බවට පිළිගෙන සිටිනු ලැබේ.

(iii) ඩිජිටල් මැන්ඩේට්පත්‍රය

මැන්ඩේට් පත්‍රය ඩිජිටල් ආකාරයෙන් භාරදිය හැකි බවට මා විසින් මෙයින් පිළිගෙන සිටිනු ලැබේ. මා විසින් ඇතුළත් කර ඇති කරුණු/දත්ත සඳහා මා විසින් මෙයින් කැමැත්ත ලබාදී ඒවා පිළිගෙන සිටින අතර මා විසින් ඩිජිටල් ලෙස ගොනුකරන ලද දත්ත සහ තොරතුරුවල නිවරදභාවය පිළිබඳ මා විසින් පිළිගෙන සිටිමි.

(iv) හානිපූරණය

යම් ගිණුමක් විවෘත කිරීම, මෙහෙයවීම, පවත්වාගෙන යැම හෝ වසා දැමීම සඳහා මා විසින් ඩිජිටල් හෝ ඉලෙක්ට්‍රොනික බැංකු සේවා භාවිත කරනු ලබන අවස්ථාවකදී, ඩිජිටල් ආකාරයෙන් මෙම ගිවිසුමට ඇතුළත්වීම නීත්‍යානුකූ බවත් ඩිජිටල් ආකාරයෙන් සිදුවන යම් ගනුදෙනුවක නීත්‍යානුකූලභාවය සම්බන්ධයෙන් අභියෝග නොකරන බවටත් මම එකඟ වෙමි. තවද, ඩිජිටල් ආකාරයෙන් සිදුවන ගනුදෙනු තුලින් හෝ එම ගනුදෙනුවල ප්‍රතිඵලයක් වශයෙන් උපචිත වන යම් සහ සියලු හිමිකම්පෑම්වලින් සහ ඒවාට එරෙහිව මා විසින් බැංකුව හානිපූරණය කර නිදහස්ව තබනු ලැබේ.

(v) විද්‍යුත් ලිපිනය/ දුරකථන අංකය

නියම සහ කොන්දේසිවල පිටපතක් ලබාගැනීමේ කාර්ය සඳහා බැංකුව වෙත නිවැරදි විද්‍යුත් ලිපිනයක් හෝ නිවැරදි සම්බන්ධවීමේ දුරකථන අංකයක් ලබාදීම සම්බන්ධයෙන් මම පරම වශයෙන් වගකිව යුතු බව මම මෙයින් පිළිගෙන සිටිමි. තවද, ගනුදෙනු පිළිබඳ දැනුවත්භාවය ලබාගැනීම සඳහා මා විසින් වලංගු ජංගම දුරකථන අංකයක් ලබාදී ඇති බවට මම පිළිගෙන සිටිමි.

20. අරලිය ගිණුම් සඳහා අදාළ වන විශේෂිත නියම සහ කොන්දේසි

(i) "NDB අරලිය" ඉතුරුම් ගිණුමක් (ගිණුම) විවෘත කිරීමේ මූලික තැන්පතුව, ඉන්පසුව අවම තැන්පතුව, පොළී අනුපාතිකය සහ පොළිය ගණනය කිරීමේ සහ ගිණුමට බැරකිරීමේ ක්‍රමවේදය, බැංකුවේ වර්තමාන රීති සහ නියෝගවලට මෙන්ම පුද්ගල ගිණුම් විවෘත කිරීමේ මැන්ඩේට් පත්‍රයේ සඳහන් නියම සහ කොන්දේසිවලට අනුකූලව සිදුවේ.

(ii) "NDB අරලිය" ඉතිරි කිරීමේ ගිණුම් හිමියා (ගිණුම් හිමියා) විසින් එක් එක් මාසයේදී, ගිණුම ආරම්භ කරනු ලබන අවස්ථාවේදී එක් එක් මාසයේදී තැන්පත් කරනු බවට එකඟ වූ මුදල ගිණුම වෙත බැරකනු ලැබිය යුතු ය. අවම එකඟවීමේ මුදල රු. 1000/ක් වේ.

(iii) ගිණුම්හිමියා විසින් එක් එක් මාසයේදී එකඟ වූ මුදල ගිණුම වෙත තැන්පත් කිරීමෙන් පසුව, බැංකුව විසින් පසු එළඹෙන මාසය ආරම්භයේදී ගිණුමට ලැබෙන පොළී මුදල මත අතිරේක පොළී මුදලක් ගෙවනු ලැබේ.

(iv) එම මාසයේදී ගිණුම්හිමියා විසින් එකඟ වූ මුදල තැන්පත් කරනු නොලබන අවස්ථාවකදී, ගිණුම් හිමියාට එම මාසය සඳහා ලැබෙන අතිරේක පොළී ගෙවීම අහිමි වන්නේය.

(v) ගිණුම විවෘත කිරීමේ ස්ථානය නොසලකා හරිමින් බැංකුවේ ඕනෑම ශාඛාවක් වෙත මුදල් තැන්පතුකිරීම් සහ ගිණුමෙන් මුදල් ආපසු ලබා ගැනීම් සිදුකරනු ලැබිය හැකි වේ.

(vi) බැංකුවේ අනන්‍ය සහ පරම අභිමතය පරිදි ඕනෑම අවස්ථාවකදී පොළී අනුපාතිකය/අනුපාතික වෙනස් කිරීම, සංශෝධනය කිරීම, වැඩිකිරීම හෝ අඩුකිරීම සඳහා බැංකුවට හිමිකමක් ඇත්තේය.

(vii) පොළී අනුපාතිකය/අනුපාතික වෙනස්වීම් පිළිබඳ නිවේදනය හෝ වෙනත් යම් නිවේදනයක් දේශීය පුවත්පතක ඇතුළත් කරනු ලබන නිවේදනයක් මගින් සහ/හෝ බැංකු පරිශ්‍රයේ ප්‍රදර්ශනය කරනු ලබන නිවේදනයක් මගින් සහ/හෝ බැංකුවේ වෙබ් අඩවියේ පළ කරන නිවේදනයක් මගින් සහ/හෝ බැංකු ප්‍රකාශයක් මගින් ලබාදිය යුතු අතර එසේ නිවේදනය

කිරීම ඒ පිළිබඳ ගිණුම්හිමියා වෙත නිසි සහ ප්‍රමාණවත් නිවේදනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර එම නිවේදන මගින් ගිණුම්හිමියා බැඳී සිටිය යුතුවේ.

(viii) චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය බැංකුවේ අභිමතය පරිදි පමණක් භාරගනු ලැබේ.

(ix) බැංකුව විසින් කලින් කලට නිශ්චිතව දක්වනු ලබන ආකාරයට ගිණුම්හිමියා විසින් අවම මාසික සාමාන්‍ය ශේෂයක් පවත්වාගෙන යෑමට නියමිත වේ.

(x) ගිණුම්හිමියා විසින් මාසික අවම සාමාන්‍ය ශේෂය පවත්වාගෙන යෑමට අපොහොසත්වන අවස්ථාවකදී, එසේ අපොහොසත් වන එක් එක් මාසය සඳහා ගාස්තුවක් අයකරනු ලැබේ.

(xi) ගිණුම්හිමියාගේ ඉල්ලීම පරිදි බැංකු පාස්පොතක්/ මාසික විද්‍යුත් ප්‍රකාශයක් නිකුත් කරනු ලැබිය හැකි අතර එහි ආරක්ෂාව සම්බන්ධයෙන් ගිණුම්හිමියා වගකියනු ලැබිය යුතුය. බැංකු පාස් පොත නැති වී, සොරකමට ලක්වී හෝ අස්ථානගත වී ඇති අවස්ථාවකදී/ විද්‍යුත් ප්‍රකාශනය බාධා ඇතිවීම හෝ අනවසර භාවිතය හේතුවෙන් හෝ වෙනත් යම් හේතුවක් නිසා සම්ප්‍රේෂණය වී නොමැති අවස්ථාවකදී ඒ පිළිබඳව බැංකු දැනුවත් කරනු ලැබිය යුතුය.

(xii) විද්‍යුත් ප්‍රකාශයක් හරහා හෝ බැංකු පාස්පොත යාවත්කාලීන කිරීම මගින් ගිණුම් විස්තර ලබාගත හැකි වේ.

(xiii) ගිණුම්හිමියා විසින් නිතිපතා ස්වකීය බැංකු පාස්පොත යාවත්කාලීන කරනු ලැබිය යුතු මෙන්ම බැංකුවෙන් පිටත්වීමට පෙරාතුව, ගිණුම්හිමියා සෑහීමට පත්වන පරිදි සියලු තැන්පත්කිරීම්, පොළිය සහ මුදල් ආපසු ලබා ගැනීම් නිවැරදිව වාර්තාගත වී ඇති බවට සහතික විය යුතුය. පරිගණකයෙන් මුද්‍රිතව නොලැබෙන හෝ බැංකුවේ බලයලත් නිලධරියකුගේ අත්සන් යටතේ ඇතුළත් කර නොමැති කිසිදු වාර්තාවක් සම්බන්ධයෙන් බැංකුව විසින් කිසිදු ආකාරයක වගකීමක් භාරගෙන සිටිනු නොලැබේ.

(xiv) යථා පරිදි සම්පූර්ණ කරන ලද මුදල් ආපසු ගැනීමේ පත්‍රිකාවක් සමග බැංකු පාස්පොත ඉදිරිපත් කිරීම මගින් මෙන්ම ATM යන්ත්‍රය හරහා මුදල් ලබා ගැනීම සිදුකළ හැකි වේ.

ඕනෑම ආකාරයකට යම් තැනැත්තකුගේ පාර්ශවයෙන් සිදුවිය හැකි කූට ක්‍රියාවක්, වංචාවක් හෝ වංක ක්‍රියාවක් නොසලකා හරිමින්, බැංකු පාස්පොත සහ ගිණුහිමියා විසින් අත්සන් කර ඇති බවට සලකනු ලබන මුදල් ආපසුගැනීමේ ආකෘති පත්‍රය ඉදිරිපත් කරනු ලබන පාර්ශවය වෙත බැංකුව විසින් කරනු ලබන ගෙවීම් කරනු ලබන අවස්ථාවකදී, එසේ කරනු ලබන ගෙවීම් සම්බන්ධයෙන් ගිණුම්හිමියා වෙත පවතින සියලු වගකීම්වලින් බැංකුව නිදහස් කර තැබිය යුතුවේ.

(xv) ගිණුම්හිමියා විසින් බැංකුව වෙත පවතින සියලු වගකීම් සහ වෙනත් යම් ගාස්තු නිරාකරණය කරන ලෙස බැංකුව විසින් ඉල්ලා සිටීම මගින් සහ ඉතිරි මුදල් ගිණුම්හිමියා වෙත ආපසු ලබාදීම මගින් ගිණුම්හිමියා වෙත සාධාරණ නිවේදනයක් ලබාදීමෙන් පසුව මෙම "අරලිය ඉතුරුම් ගිණුම්" සේවාව අවසන් කිරීම සඳහා බැංකුව වෙත අයිතිය රඳවා ගනු ලැබේ.

(xvi) බැංකු පාස් පොතක් නැති වී හෝ විනාශ වී ඇති අවස්ථාවකදී, සෑහීමට පත්විය හැකි සාධාරණීකරණය කිරීමක් සහ ප්‍රමාණවත් හානිපූරණයක් ලැබීමෙන් පසුව, ගිණුම්හිමියා විසින් ක්‍රියාත්මක කර ඇති ගනුදෙනු විස්තර ඇතුළත් වන අලුත් බැංකු පාස්පොතක් බැංකුව විසින් නිකුත් කරනු ලැබිය හැකි අතර එම බැංකු පාස්පතෙහි ඇතුළත් වන ගනුදෙනු විස්තර නිවැරදි බවට ගිණුම්හිමියා විසින් පිළිගනු ලැබිය යුතුය. බැංකු පාස් පොතක් නැවත නිකුත් කිරීම සම්බන්ධයෙන් ගාස්තුවක් අදාළ වන්නේය.

(xvii) ගිණුම්හිමියාගේ ලිපිනය වෙනස්වීම ඇතුලු ගිණුම්හිමියාගේ පුද්ගලික විස්තරවල සිදුවන වෙනස්වීම් ප්‍රමාදයකින් තොරව ගිණුම්හිමියා විසින් බැංකුව වෙත දැනුම් දිය යුතුය.

(xviii) ගිණුම්හිමියා වෙත නිවේදනය කිරීමෙන් ඕනෑම අවස්ථාවකදී ගිණුමට අදාළ නියම සඳහා යමක් එකතු කිරීම සඳහා හෝ එම නියම වෙනස්කිරීම සඳහා බැංකුව වෙත අයිතිය රඳවා තබා ගනු ලැබේ.

(xix) පුද්ගල ඩිජිටල් ගිණුම් විවෘත කිරීමේ මැන්ඩේට්පත්‍රයේ අන්තර්ගත නියම සහ කොන්දේසි සමඟ එක්ව මෙම නියම සහ කොන්දේසි කියවනු ලැබිය යුතුය.

NDB bank
Our Commitment. Your Success.

(xx) පුද්ගල ඩිජිටල් ගිණුම් විවෘත කිරීමේ මැන්ඩේට් පත්‍රයේ නියම සහ කොන්දේසි සහ අරලිය ගිණුම් සඳහා අදාළ වන මෙම විශේෂිත නියම සහ කොන්දේසි අතර යම් ගැටුම් සහගත තත්ත්වයක් ඇතිවුවහොත්, එවිට අරලිය ඉතුරුම් ගිණුම් සඳහා අදාළ වන විශේෂිත නියම සහ කොන්දේසි බලාත්මක විය යුතුය.

(xxi) වෙළඳපල තත්ත්වයන් මත රඳාපවතිමින් දැනට බලපවත්නා ත්‍යාග යෝජනා ක්‍රමය වෙනස්කිරීමේ අයිතිය බැංකුව සතුවන අතර එවැනි වෙනස්වීම් බැංකුවේ වෙබ් අඩවියේ සහ බැංකුවේ එක් එක් බැංකු ශාඛාවල දැන්වීම් පුවරු මත ප්‍රදර්ශනය කරනු ලැබේ.

21. රියල් සේවර් ගිණුම්වලට අදාළ වන විශේෂිත නියම සහ කොන්දේසි

(i) NDB රියල් සේවර් ගිණුමක් (ගිණුම) විවෘත කිරීමේ මූලික තැන්පතුව, ඉන්පසු අවම තැන්පතුව, පොළී අනුපාතිකය සහ පොළී අනුපාතිකය ගණනය කිරීමේ සහ ගිණුමට බැර කිරීමේ ක්‍රමවේදය, බැංකුව වර්තමාන රීති සහ නියෝගවලට මෙන්ම පුද්ගල ගිණුම් විවෘත කිරීමේ මැන්ඩේට්පත්‍රයේ සඳහන් නියම සහ කොන්දේසිවලට අනුකූලව සිදුවේ.

(ii) ගිණුම්හිමියා විසින් ගිණුම ආරම්භ කරනු ලබන අවස්ථාවේදී එක් එක් මාසයේ දී තැන්පත් කරනු ලබන බවට එකඟ වූ මුදල (එකඟ වූ මුදල) ගිණුම වෙත බැරකරනු ලැබිය යුතුය. අවම එකඟවීමේ මුදල් රු.1000 /=ක් වේ.

(iii) ගිණුම්හිමියා විසින් එක් එක් මාසයේදී එකඟ වූ මුදල ගිණුම වෙත තැන්පත් කිරීමෙන් පසුව, බැංකුව විසින් ගිණුම්හිමිවා වෙත ගිණුමට ලැබෙන පොළී මුදල මත අතිරේක පොළී මුදලක් පසුව එළඹෙන මාසය ආරම්භයේදී ගෙවනු ලැබේ.

(iv) එම මාසයේදී ගිණුම්හිමියා විසින් එකඟ වූ මුදල තැන්පත් කරනු නොලබන අවස්ථාවකදී, ගිණුම්හිමියාට එම මාසය සඳහා ලැබෙන අතිරේක පොළී ගෙවීම අහිමි වන්නේය.

(v) ගිණුමෙන් මුදල් ආපසු ලබාගැනීම් මාසයකට එක් මුදල් ආපසු ගැනීමක් සඳහා සීමාකර ඇත. එක් කැලැන්ඩර් මාසයක් ඇතුළත ගිණුම්හිමියා විසින් ගිණුමෙන් එක් වරකට වැඩි වාරගණනක් මුදල් ආපසු ලබාගන්නා අවස්ථාවකදී එවිට, එම මාසය සඳහා 3 වන වගන්තිය ප්‍රකාරව ලැබෙන අතිරේක පොළී මුදල ගිණුම්හිමියාට අහිමි වන්නේ ය.

(vi) ගිණුම විවෘත කිරීමේ ස්ථානය නොසලකා හරිමින් බැංකුවේ ඕනෑම ශාඛාවක් වෙත මුදල් තැන්පතුකිරීම් සහ ගිණුමෙන් මුදල් ආපසු ලබා ගැනීම් සිදුකරනු ලැබිය හැකි වේ.

(vii) ඉතිරිකිරීමේ පුරුද්ද සඳහා උනන්දුකරවීම පිණිස මෙම ගිණුම මත ඩෙබිට් කාඩ්පතක් නිකුත් කරනු නොලැබේ.

(viii) යථා පරිදි සම්පූර්ණ කරන ලද මුදල් ආපසු ගැනීමේ පත්‍රිකාවක් සමඟ බැංකු පාස්පොත ඉදිරිපත් කිරීම මගින් මුදල් ලබා ගැනීම සිදුකළ හැකි වේ. ඕනෑම ආකාරයකට යම් තැනැත්තකුගේ පාර්ශවයෙන් සිදුවිය හැකි කූට ක්‍රියාවක්, වංචාවක් හෝ වංක ක්‍රියාවක් නොසලකා හරිමින්, බැංකු පාස් පොත සහ ගිණුහිමියා විසින් අත්සන් කර ඇති බවට සලකනු ලබන අදාළ මුදල් ආපසුගැනීමේ ආකෘති පත්‍රය ඉදිරිපත් කරනු ලබන පාර්ශවය වෙත බැංකුව විසින් ගෙවීම්කරනු ලබන අවස්ථාවකදී, එසේ කරනු ලබන ගෙවීම් සම්බන්ධයෙන් ගිණුම්හිමියා වෙත පවතින බැංකුවේ සියලු වගකීම්වලින් බැංකුව නිදහස් කර තැබිය යුතුවේ.

(ix) චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය බැංකුවේ අභිමතය පරිදි පමණක් භාරගනු ලැබේ.

(x) සෑම එක් එක් ගිණුම්හිමියකු වෙතම බැංකු පොතක් නිකුත් ලබන අතර එම බැංකු පාස්පොත ආරක්ෂාකර ගැනීම ගිණුම්හිමියාගේ වගකීම වන්නේ ය. බැංකු පාස්පොත නැතිවුවහොත්, සොරකමට ලක්වුවහොත් හෝ අස්ථානගතවුවහොත්, ඒ පිළිබඳව බැංකුව දැනුවත් කරනු ලැබිය යුතු ය.

(xi) ගිණුම්හිමියා විසින් නිතිපතා ස්වකීය බැංකු පාස්පොත යාවත්කාලීන කරනු ලැබිය යුතු මෙන්ම බැංකුවෙන් පිටත්වීමට පෙරාතුව, ගිණුම්හිමියා සෑහීමට පත්වන පරිදි සියලු

තැන්පත්කිරීම්, පොළිය සහ මුදල් ආපසු ලබා ගැනීම් නිවැරදිව වාර්තාගත වී ඇති බවට සහතික විය යුතුය. පරිගණකයෙන් මුද්‍රිතව නොලැබෙන හෝ බැංකුවේ බලයලත් නිලධරියකුගේ අත්සන් යටතේ ඇතුළත් කර නොමැති කිසිදු වාර්තාවක් සම්බන්ධයෙන් බැංකුව විසින් කිසිදු ආකාරයක වගකීමක් භාරගෙන සිටිනු නොලැබේ.

(xii) බැංකුව වෙත ලැබියයුතු ගිණුම්හිමියාගේ සියලු වගකීම් ගෙවා නිරාකරණය කරන ලෙස ඉල්ලා ගෙවා නිරාකරණයකර ගැනීමෙන් පසුව ගිණුම්හිමියා වෙත සාධාරණ නිවේදනය කිරීමක් සිදුකිරීම මගින් මෙම NDB රියල්සේවර් ගිණුම් යෝජනාක්‍රමය අවසන්කිරීමේ අයිතිය බැංකුව වෙත රඳවා ගනු ලබන අතර ඉන්පසුව මෙම ගිණුම් පවතින ඉතිරි මුදල් බැංකුව සමග පවතින සාමාන්‍ය ඉතුරුම් ගිණුමක් වෙත මාරුකරනු ලැබේ.

(xiii) බැංකු පාස් පොතක් නැතිවී හෝ විනාශවී ඇති අවස්ථාවකදී, සෑහීමට පත්විය හැකි සාධාරණීකරණය කිරීමක් සහ ප්‍රමාණවත් හානිපූරණයක් ලැබීමෙන් පසුව, බැංකුව විසින් පවතින ශේෂය අලුත් ගිණුමකට මාරුකර අලුත් බැංකු පාස්පොතක් නිකුත් කරනු ලැබිය හැකි අතර එම බැංකු පාස්පතෙහි ඇතුළත් වන ගනුදෙනු විස්තර නිවැරදි බවට ගිණුම්හිමියා විසින් පිළිගනු ලැබිය යුතුය. බැංකු පාස් පොතක් නැවත නිකුත් කිරීම සම්බන්ධයෙන් ගාස්තුවක් අදාළ වන්නේය.

(xiv) ලිපිනයෙහි යම් වෙනසක් සිදුවුවහොත් ගිණුම්හිමියා විසින් ප්‍රමාදයකින් තොරව ඒ පිළිබඳ බැංකුව වෙත දැනුම් දිය යුතුය.

(xv) ගිණුම්හිමියා වෙත නිවේදනය කිරීමෙන් තොරව ඕනෑම අවස්ථාවකදී ගිණුමට අදාළ නියම සඳහා යමක් එකතු කිරීම සඳහා හෝ එම නියම වෙනස්කිරීම සඳහා බැංකුව වෙත අයිතිය රඳවා තබා ගනු ලැබේ.

(xvi) පුද්ගල ඩිජිටල් ගිණුම් විවෘත කිරීමේ මැන්ඩේට්පත්‍රයේ අන්තර්ගත නියම සහ කොන්දේසි සමඟ එක්ව මෙම නියම සහ කොන්දේසි කියවනු ලැබිය යුතුය.

(xvii) පුද්ගල ඩිජිටල් ගිණුම් විවෘත කිරීමේ මැන්ඩේට් පත්‍රයේ නියම සහ කොන්දේසි සහ රියල් සේවර් ගිණුම් සඳහා අදාළ වන මෙම විශේෂිත නියම සහ කොන්දේසි අතර යම් ගැටුම් සහගත තත්ත්වයක් ඇතිවුවහොත්, එවිට රියල් සේවර් ඉතුරුම් ගිණුම් සඳහා අදාළ වන විශේෂිත නියම සහ කොන්දේසි බලාත්මක විය යුතුය.

22. පාලනය වන නීතිය

අරලිය ගිණුම් සඳහා අදාළ විශේෂිත නියම සහ කොන්දේසි සහ රියල් සේවර් ගිණුම් සඳහා අදාළ වන විශේෂිත නියම සහ කොන්දේසි ඇතුලු මෙම නියම සහ කොන්දේසි ශ්‍රී ලංකාවේ නීතිය මගින් පාලනය වන මෙන්ම එසේ පාලනය වන ලෙස සලකනු ලැබිය යුතු අතර ශ්‍රී ලංකාවේ අධිකරණවල අනන්‍ය අධිකරණ බලය වෙත මේ සම්බන්ධයෙන් උපචිත වන ගැටලු අහෝසි කළ නොහැකි ලෙස මෙයින් යොමුකර සිටින බවට කියාසිටිනු ලැබේ. එසේ වුවද වෙනත් යම් අධිකරණ කලාපයකදී මට එරෙහිව නඩු කටයුතු ගෙන ඒම සඳහා වූ බැංකුවේ අයිතියට එම යොමුකිරීම මගින් අගතියක් සිදු නොවිය යුතුය.

23. නියම සහ කොන්දේසි පිළිගැනීම

බැංකුව විසින් ස්වකීය නිල වෙබ් අඩවියෙහි පළකිරීම මගින් මා වෙත ඉදිරිපත් කරනු ලැබූ පුද්ගල ඩිජිටල් ගිණුම් සඳහා අදාළ වන මෙම නියම සහ කොන්දේසි, අරලිය ගිණුම් සඳහා අදාළ වන විශේෂිත නියම සහ කොන්දේසි, රියල් සේවර් ගිණුම් සඳහා අදාළ වන විශේෂිත නියම සහ කොන්දේසි මා විසින් කියවා අවබෝධ කරගනු ලැබූ බවත් ඉහතකී නියම සහ කොන්දේසි පිළිගැනීම පිළිබඳ සංකේතයක් වශයෙන් මා විසින් මැන්ඩේට්පත්‍රය ඩිජිටල් ආකාරයෙන්/ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් අත්සන් කර ඇති බවත් මා විසින් තහවුරු කර සිටිනු ලැබේ.